පාලිපද්‍යාත්මක

# ලො කො ප කා ර ය

රත්මලානේ පරමධම්මචේතිය පරිවේණාධිස්වාමිව
වැඩවිසූ පණ්ඩිතාචාර්‍ය්‍ය

## වලානේ ශ්‍රී සිද්ධාර්ථ ධර්මානන්දාභිධාන

**ශ්‍රී කල්‍යාණි සාමග්‍රිධර්ම මහා සංඝසභාවෙ**
මහානායක මාහිමියාණන්වහන්සේ විසින්
වි ර චි ත යි.

---

**තවජ්ඣ සූරියගොඩ සුමංගල සාමීන් විසින්**
ලියනලද සන්න සහිතයි.

---

ගණේගොඩැල්ලේ සුභද්‍රාරාමාධිවාසී
පූර්වොක්ත සංඝසමිතියේ මහොපාධ්‍යාය ධුරන්ධර
ගෞරවාහී ගණාචාර්‍ය්‍ය

## ගු ණ ර ත නා භි ධා න

**මහාස්ථවිරපාදයන්වහන්සේ විසින්**
සමාරාධිතයි.

---

**ඩී. ඒ. ගුණතිලක මහතා විසින්**
කොළඹ විද්‍යාසාගර යන්ත්‍රාලයෙහි
මුද්‍රාපිතයි.

**ශ්‍රී බු. ව. 2455. * කිතුවස් 1911.**

පාලිපද්‍යාත්මක

# ලෝ කෝ ප කා ර ය

රත්මලානේ පරමධම්මචෛතිය පරිවෙණාධිස්වාමිව
වැඩවිසූ පණ්ඩිතාචාර්ය්‍ය

## වලානේ ශ්‍රී සිද්ධාර්ථ ධර්මානන්දාභිධාන

**ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්ම මහා සඞ්ඝසභාවේ**
මහානායක මාහිමියානන්වහන්සේ විසින්
වි ර චි ත යි.

---

**තච්ඡිෂ්‍ය සූරියගොඩ සුමඞ්ගල සාමීන් විසින්**
ලියනලද සන්න සහිතයි.

---

ගණේගොඩැල්ලේ සුනන්දාරාමාධිවාසී
පූර්වෝක්ත සඞ්ඝසමිතියේ මහෝපාධ්‍යාය ධුරන්ධර
ගෞරවාහී ගණාචාර්ය්‍ය

## ගු ණ ර ත නා භි ධා න

**මහාස්ථවිරපාදයන්වහන්සේ විසින්**
සමාරාධිතයි.

---

**ඩී. ජේ. ගුණතිලක මහතා විසින්**
කොළඹ විද්‍යාසාගර යන්ත්‍රාලයෙහි
මුද්‍රාපිතයි.

---

**ශ්‍රී බු. ව. 2455.** * **ක්‍රිතුවර්ෂ 1911.**

# THE LOKOPAKĀṚA

*a poem on morals and ethics in Pali*

BY

THE LATE

**Venerable Walane Sri Siddhartha Dharmananda Mahathera**

PRINCIPAL OF THE

PARAMA DHAMMA CETIYA ORIENTAL COLLEGE,

RATMALANE,

HIGH PRIEST OF

**The Sri Kalyani Samagri Dharma Maha Sanghasabha**

AND A MEMBER OF THE STANDING COMMITTEE

ON ORIENTAL STUDIES, COLOMBO.

EDITED

*With a Sinhalese Literary Paraphrase*

BY

**The Revd. Suriyagoda Sumangala Thera**

*Vice-Principal of the*

PARAMA DHAMMA CETIYA ORIENTAL COLLEGE,

RATMALANE,

AND A MEMBER OF THE

ROYAL ASIATIC SOCIETY

C. B.

AND OF THE COMMITTEE

ON ORIENTAL STUDIES, COLOMBO.

PUBLISHED BY

D. A. Goonatilaka

*THE VIDYASAGARA PRINTING WORKS, COLOMBO.*

**B: E: 2455.**

*All rights reserved.*

*To*

*The Hon'ble Rajarshi Raja Vadai Pratap Singh.*

*C. S. I.* .

# RĀJĀ OF BHINGĀ

IN TOKEN OF HIS ARDENT DESIRE

FOR THE PROMOTION

OF

## PALI LITERATURE

THIS POEM IS BY SPECIAL PERMISSION DEDICATED

BY

THE AUTHOR AND EDITOR.

මේ

## ලොකොපකාරය

දඹදිව ක්‍ෂත්‍රියවංශශෙඛරායමානවූ

ශ්‍රීමත් භිඞගාභි රජතුමානන් විසින්

සමාදරයෙන් පිළිගන්නාලදී.

# INTRODUCTION.

Sinhalese Literature is so rich that it embraces almost every branch of knowledge. Poetry occupies a very prominent position in it both by its richness and beauty. All the poetical works of the Sinhalese language can be arranged in three different classes viz:- "Gi," "Silo" and "Kav," according to the different styles in which they are written.

At an early period, prior to the pre-eminent Oriental scholar, the most worshipful Sangharaja Totagamuve Sri Rahula, the Supreme Master of Six languages, Sinhalese poetry was chiefly written in a kind of blank verse called "Gi," but subsequently a style of verse was employed wherein rhyme formed a prominent feature. Among the works of this former class, the Kavsilumina, Muwadevda etc. are considered to be pre-eminent. Next to them, but possessing the same poetical beauty and sweetness, comes, the Lokopakara, which is universally held to be an invaluable poem as regards moral and ethical teachings.

The Lokopakara was originally composed in Sinhalese "Gi" by a Buddhist monk known as Ranasgalle Teruunanse, after the name of his native village Ranasgalla supposed to be in Siyanekorale. It has been verified that this scholarly author flourished about the year 1799 at the Totagamu vihara, as a contemparory of the Ven'ble Karatota Sri Dharmarama Nayakethera, at Matara. About this time oriental learning was greatly affected by the unrest of the Island chiefly due to the constant struggle for supremacy between the Dutch and the Sinhalese, hence a work of this nature is worthy of more than ordinary praise.

This poem is indispensable to the student of oriental morals and ethics as it dwells entirely on the moral and ethical teachings culled not only from the Buddhistic canonical works, but also from Sanskrit works such as Mahabharata, Puranas, Pancatantra, Hitopadesa etc. It is regarded as a work of high authority in the Sinhalese language and is much used in our schools and oriental colleges and it is a standard text-book for examinations of the Department of Public Instruction and of the committee on Oriental Studies, Colombo. This

work was revised and edited with a valuable paraphrase in Sinhalese by the Ven'ble M. Goonaratana Mahathera, of Siri Sunandarama, Butgamuwa.

At the request of the said learned editor my preceptor the late Venerable W. Sri Siddharttha Dharmananda, High Priest, undertook the present work deeming it worthy of being clothed in the poetical garb of the Pali language in its original magnificence and purity and completed it about two years ago.

The late Sri Siddhartha Dharmananda, High Priest, was at an early age was sent to the late Venerable Dehipitiye Sangharakkhita Mahathera, a monk of much piety and high integrity of the Siri Siddhattharama, at Walane, for his initiation as a novice from whom he had received his elementary education. He obtained his higher ordination as a disciple of the most eminent orienial scholar, the late Venerable Walane Sri Siddhartha Mahathera, the founder and principal of this oriental college, and the leader of the revival of oriental studies in Ceylon. Then he was sent to the most illustrious oriental scholar H. Sri Sumangala High Priest, the late Principal of the Vidyodaya Oriental College, Colombo, for his higher education, with whom he deligently completed his course of studies and became an accomplished scholar in Oriental languages, philosophy and science. Appreciating his abilities and his scholarly attainments, the Venerable Principal appointed him as his Assistant in which capacity he greatly helped his tutor to promote oriental studies in Ceylon.

In 1886, at the request of the Venerable Sangharakkhita Mahathera and the Dayakas at Ratmalana, he accepted the Principalship of the Parama Dhamma Cetiya Oriental College, Ratmalane, the oldest oriental institute in the island where the most illustrious oriental scholars such as Pandit Batuvantudawe, H. Sri Sumangala High Priest and Ratmalane Sri Dharmaloka Mahathera, received their education; and within a few years he restored the institution to its original position. In 1888 Sir Arthur Hamilton Gordon, the then Governor of Ceylon (Lord Stanmore) who presided over a prize-distribution expressed his deepest sympathy with the admirable work done in the college.

Venerable Sri Dharmananda had hundreds of pupils, great many of them have become prominent scholars who have composed several original works and some of them have founded

similar institutions in various parts of the Island. It should be mentioned here that none of his pupils who took the examinations held annually by the committee on oriental studies failed; some of them obtained distinctions and honours and won prizes and medals, nay it is one of his pupils who won the Gold Medal for the first time awarded by the committee on oriental studies, Colombo. He was recognized to be one of the best poets in Pali, not to speak of his prose-writings. As an appriciation of his earnest devotion to the religious duties he was unanimously elected as the High Priest of the Sri Kalyani Samagri Dharma Maha Sanghasabha, Colombo, in 1908; and in that capacity he had discharged his duties remarkably well. He was one of the most valued members of the committee on Oriental studies, the chairman of which, J. Harward Esq. M. A. the Director of Public Instruction, in Ceylon, has recorded his death with regret in his report for 1911 in the following words "We also lost the Ven. W. Dhammananda High Priest, Principal of the Parama Dhamma Cetiya Pirivena, at Ratmalane, who was a great scholar, and a very useful member both on our standing committee and on our Board of Examiners."

For some months before his death he was in poor health but was always cheerful and contented, and continued his religious performances and meditations to the last moment. At 3. 30 A. m. on Sunday the 8th January 1911 he peacefully passed away after leading a fruitful and examplary spiritual life extending over 55 years.

Venerable Dharmananda set a noble example to his followers by his self-sacrifice, moral rectitude and earnest devotion to religious duties. He hated none and cared little for popular applause but simply did what he clearly felt to be his duty. His was literally a life of piety and meditation.

**S. S.**

*Parama Dhamma Cetiya Pirivena,*
*Ratmalana, Mt. Lavinia, 6th Dec. 1911.*

# ස ං ඥා ප න ය.

ශ්‍රීමතාමතසම්පත් මකුටායමාන තොටගමුවේ ෂට්භාෂාපරමෙශ්වර ශ්‍රීරාහුල සඞ්ඝරාජ මහාස්වාමිපාදයන් වහන්සේගේ චිරාධිවාසශ්‍රිය ලදින් ධන්‍යතර භාවප්‍රාප්ත තොටගමු මහාවිහාරයෙහි මීට හවුරුදු එකසිය දෙළහකට පෙර බෙහෙවින් වැඩවිසූ ස්වසමය සමයාන්තර ප්‍රවීණ ප්‍රශස්ත බුද්ධිමත් සෞශීල්‍යාද්‍යුචිත ගුණගණාභරණවූ රණස්ගල්ලේ මහාස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ විසින් ත්‍රිපිටක බුද්ධවචනය හා මහාභාරත, පුරාණාදි පරසමයාන්තගීතවූද, පඤ්චතන්ත්‍ර හිතොපදෙශාදි නීතිශාස්ත්‍රාන්තගීතවූද, ප්‍රශස්ත ග්‍රන්ථයන් සමුපාශ්‍රයකොට නවීනයන්ගේ ප්‍රඥාභිවෘද්ධිය සඳහා විචිත්‍රොපමාර්ථසාරතා පදලාලිත්‍යාදි කවිසම්භාව්‍ය සුමිශ්‍ර ගුණයන්ගෙන් සමුපලක්ෂිතකොට සුපිරිසිදු හෙළුගීවලින් විරචිත විචජ්ජන පරමානන්දජනකවූ **ලොකොපකාරය** චිරාත්කාලයක් මුලුල්ලෙහි ස්වදෙශවාසී හුදීජනතැමති භෘඞ්ගශ්‍රෙණීන් විසින් සුමධුර මධුපටලයක්සේ ආස්වාදනය කරණුලබන නමුත් හෙළුබස නොදත් අශෙෂදෙශවාසීන්ගේ චමත්කාර ජනනය ශූන්‍ය ප්‍රායව පවතියි. එහෙයින් ඒ හෙළුලොකොපකාරය මනීෂිජන සම්භාවණීය සිංහලාර්ථසංවණිතා සමුපෙතකොට පරොපකාරය සඳහා මුද්‍රණය කරවීමෙන් ප්‍රසිද්ධකොට එහි ග්‍රන්ථගෞරවය යථාස්ථානයෙහි ප්‍රතිෂ්ඨාපනය කළාවූ "ශ්‍රීකල්‍යාණී සාමග්‍රී ධර්මමහාසඞ්ඝසමිතියේ" මහොපාධ්‍යාය පදප්‍රාප්ත බුත්ගමුවේ ගණේගොඩැල්ලේ සුනන්දාරාමවිහාරාධිවාසී අතිගෞරවාර්හ ගණාචාර්ය මුල්ලෙරියාවේ **ගුණරත්නාභිධාන** මහාස්ථවිරස්වාමිපාදයානන්වහන්සේ විසින් සමාරබ්ධතවූ "ශ්‍රීකල්‍යාණී සාමග්‍රීධර්ම මහා සඞ්ඝ සමිතියෙහි" ප්‍රධාන සඞ්ඝනායක ධුරන්ධර රත්මලානේ පරමධම්මචෙතිය පරිවෙණාධිපතිව වැඩවිසූ අස්මදාචාර්ය මාහිමියානන්වහන්සේ විසින් එය විශුද්ධ ශුද්ධමාගධීභාෂාවට නගා මාගධී පද්‍යාත්මක කෘතියක් නිපදවීමෙන් අශෙෂදෙශවාසී නවීනප්‍රවීණ ජනතාවට ලබාදිය හැකි විපුලප්‍රයොජනයසලකා සදුපමාර්ථ රසමාධුර්යාදියෙන් සමෘද්ධකොට සම්පාදනයකරණලද පද්‍යරචනාවක්වූ මේ **පාලිලොකොපකාරය** ධම්මපද, සද්ධම්මොපායනය ආදියමෙන් ධර්මශාස්ත්‍රාදග්‍රහණයෙහිද පඤ්චතන්ත්‍ර, හිතොපදෙශාදියමෙන් නීතිශාස්ත්‍රාදග්‍රහණයෙහිද නවීනයන් විසින් අත්‍යන්ත සම්භාවිතව්‍යමැයි.

මීට හවුරුදු දෙකකට පමණ පෙර අස්මදාචාර්ය මාහිමියානන් වහන්සේ මේ පද්‍යරචනාව නිමවා මෙහි සන්නයද අප ලවා ලියවා මෙහි මුද්‍රණය පූජ්‍යෝත්තම ගණාචාර්ය ගුණරතන මහාස්ථවිර ස්වාමිපාදයන්වහන්සේගේ අනුමතිපරිදි කරණලෙසපැවරූ නමුත් අප මාහිමිසන්වහන්සේට ගිලානෝපස්ථානාදියකිරීම පිළිබඳවම කාලය ගතකිරීම අතිශයින්ම ආවශ්‍යකබැවි සලකා ඒසඳහාම අප හැමට ව්‍යාවෘතවෙන්ට විය. එසේදවුවත් අප මාහිමියානන් වහන්සේ සර්ව සංස්කාර ධර්මයන්ගේ අනිත්‍යස්වභාව අපට අඳුන්වාදෙමින් සිහිනුවණින්යෙදී ස්වර්ගපරායණවූයෙන් අප හැමගේම අනල්ප ව්‍යාපාර විඵලප්‍රායවූවා පමණක්නොව මෙය මුද්‍රණයෙන් ප්‍රචලිතකරවීමද ප්‍රමාදවිය.

මෙබඳු කෘතියක් සම්පූර්ණයෙන් නිදෙස්ලෙස සම්පාදනය කිරීම සර්වඥ නොවන කාගේත් සාමර්ථ්‍යයට ගෝචර නොවන හෙයින් මෙහිදු දෙස්ඇතිවීම අරුමයක් නොවනනමුත් මේ අපගේ ව්‍යාපාරය සුධීජන මනොනන්දජනනයට හා නවීනයන්ගේ ඥනාභිවෘද්ධිය පිණිසද ප්‍රමාණවේය යනු අස්මදීයෙෂ්ටාශංසන පූර්වක කල්පනාවයි

සූරියගොඩ **සුමඞ්ගල ස්ථවිරයෝය.**

රත්මලානේ
පරමධම්මචේතිය පිරිවෙණේදීය.

# කත්තු සන්දස්සනා.

1. පසන්න ජනතා කිණ්ණෙ නෙකස්සිරි විරාජිතෙ,
විසිට්ඨ තිත්ථගාමට්ඨ විහාරෙ චිරවාසිනා;

2. විත්ථතානන්ත වික්කන්ති-දයා ඤාණ ගුණිද්ධිනා,
සුධී ජනින්දුරවින්ද-කුන්ද රඤ්ඤ රවින්දුනා;

3. කල්ලෙලන නෙක සත්ථෙසු සද සල්ලෙඛවුත්තිනා,
"**රණස්ගල්ලේ**"ති විඛ්‍යාත-ථෙරවරන ඛ්‍යාතකිත්තිනා;

4. පසත්ථානෙක සද්දූප-දෙසාලඞ්කාර ලඞ්කතො,
කවිප්පසත්ථො යො ගන්ථො දීපභාසාය දීපිතො.

5. යා වණ්ණණියා යස්සත්ථ-වණ්ණණා යෙන වණ්ණිතා
සංවණ්ණිතානන්තසන්ත-ගුණ සඞ්ඝ නිසෙවිතා

6. සද කිණ්ණ ජනගාම-බුද්ධගාම ගණත්ථල,
**සුනන්දාරාම** විඛ්‍යාත- විහාර මධිවාසිනා;

7. **සිරි කල්‍යාණි සාමග්ගී**-ධම්මාරූ සඞ්ඝ සංසදෙ.
මහොපජ්ඣාය භූතෙන කල්‍යාණජ්ඣාසයෙන තු;

8. **ගුණරතන** සමඤ්ඤෙන මහාථෙරෙන විඤ්ඤුනා,
තෙනා 'භියාචිතො සම්මා සපරත්ථ හිතෙසිනා.

9. සද 'තිරම්මං **පරම ධම්මචෙතිය** විස්සුතං,
**පරිවෙණ**ජ්ඣාවසන්තො සන්තොසී ගණ වාචකො;

10. සිද්ධත්ථො "**සිරි සිද්ධත්ථ ධම්මානන්ද**,, ති විස්සුතො,
**නායකත්ථවිරො** ථිරො සපරත්ථ හිතත්ථිකො;

11. සො හිත්වා ද්විජභාසං තං සම්මත ජනතාහිතං,
තං තන්තිභාසං සහිත-හිතං චා 'රෙපසී සුභං.

12. සම්බුද්ධ පරිනිබ්බාණා වස්සෙ චතුසතාධිකෙ,
විසහස්ස තිපඤ්ඤාසෙ ජෙට්ඨමාසෙ පරෙ දලෙ;

13. සසාභිරෙක විසත-ගන්ථොභි පරිනිට්ඨිතො,
**ලොකොපකාරො** '**යං** ලොකෙ සද 'චෙරව භාසතූ'ති.

—*—

සන්න සහිත

# ලෝකෝපකාරය.

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.**

1. විසුද්ධචරිතං බුද්ධං නත්වා ලෝකත්ථසිද්ධියා,
ලෝකෝපකාරං භාසිස්සං තනාභිභාසාය සඞ්ඛතො.

---

සුවිසුද්ධාසයං බුද්ධං ධම්මං යෙන නිසෙවිතං,
තෙනප්පසන්නං සඞ්ඝං ච නත්වා සඞ්ඝනන්දනං.

**ධම්මානන්ද**යතිනෙන භදන්තා'චරියෙන මෙ,
වුත්තං වණ්ණෙමි ලෝකෝප-කාරං නිජනිරුත්තියා.

ශ්‍රී ලඞ්කාවිප්පවාසනව්‍ය සම්සත කවිවෘන්දමනඃකුමුද සන්දෝහ විකාශ නෛකශරදින්දු බිම්බප්‍රතිභාගවූ **පරමධම්මචෛත්‍ය පරිවෙණාධිපති මේ ආචාර්ය්‍ය මහාස්වාමිපාදයෝ** නිසර්ගසිද්ධ පරහිතනිරතාශයෙන් සකල ලෝකවාසීන්ට ඓහිකාමුෂ්මික හිතසුඛාභිවෘද්ධ්‍ය ජනවනු සඳහා එළුබසින් තුබූ "**ලෝකෝපකාර**" නම්වූ ඒ ප්‍රකරණය පෙළ බසින් විනිර්මුවැ ප්‍රාරිප්සිත නිෂ්ප්‍රත්‍යූහ පරිසමාපනසඳහා රසංරක්ෂණාදිය අපේක්ෂාකොටඇති මඞ්ගලාචරණය කරණුවෝ "**විසුද්ධචරිතං බුද්ධං**" ඉත්‍යාදීන් භගවන්නමස්කාර මුඛයෙන් ග්‍රන්ථාරම්භකළෝ.

එහි සමුදායාර්ථ අවයවාර්ථ විසින් අර්ථය ද්විප්‍රකාරවේ. සමුදායාර්ථ නම් ඉෂ්ටදෙවතා නමස්කාරය හා සංක්ෂේපාර්ථ පවකසී. අවයවාර්ථ නම් රචනාගත පදයන්ගේ ව්‍යුත්පත්තිය හා පදගතවූ අර්ථයි. ඒ හැම ගෙණහැර දක්වත් ඉතා බෙහෙව; එබැවින් විස්තරාර්ථ හැර අව්‍යුත්පන්න බාල ජනානුග්‍රහය පිණිස පදගතාර්ථ මාත්‍රයක් දක්වම්හ.

1. "බුද්ධං **නත්වා ලෝකෝපකාරං භාසිස්සං**" යි ක්‍රියාකාරක පද සම්බන්ධයි. බුද්ධං නත්වා, බුදුන්වැඳ; ලෝකෝපකාරං, එනම් ප්‍රකරණයක්; භාසිස්සං, කියම්. කුමකින් විශිෂ්ටවූ බුදුන් වැඳ කුමක් පිණිස කෙසේ කියනුවහ? යනු අනන්තර්ලීන චෝදනායි. ඒ මෙසේ පරිහරණය කෙරෙත්.

විසුද්ධචරිතං, අනල්පකල්පකෝටිශතසහස්‍රකාලාභ්‍යස්ත සමත්‍රිංශත් පරිමිත පාරමිතා සම්භාර භරණයෙන් හා ලෝකාර්ථඥාත්‍යර්ථ බුද්ධ චර්‍යා

2. තිලොකෙ'පි සමො නත්‍ථි මුනිනා මුනිනා විනා,
තාරා සසඞ්කසඞ්කාසා නත්‍ථි තාරාපථෙ යථා.

3. දිනානක්ඛිරතනමංසෙහි ජේනායෙ'වා 'සමා'සු'පි,
භුවි තාරොදධිභූසුඤ්ඤිරත්තා ජෙතපත්‍ථිකා.

---

ත්‍රය පූරණයෙන් ද උත්සාහ උන්මාගි අවස්ථාන හිතචර්‍ය්‍යාසඞ්ඛ්‍යාත චතුර්විධ මහාසත්ව ගුණයෙන් හා අලොභ අද්වෙෂ අමොහ නෛෂ්ක්‍රම්‍ය ප්‍රවිවෙක නිඃසරණාත්මක ෂඩ්ධ්‍යාශය සම්පත්තීන්ද විශුද්ධවූ; නොහොත් පූරණකාශ්‍යපාදී ඥානලව දුර්විදග්ධ අන්ධබාලජනයන්ගේ, චරිතාවදාන සෙයින් ශ්‍රෝතෘවූ විඥයන්ට ජුගුප්සාජනක නොවන්නෙන් පරිශුද්ධවූ චරිත ඇති; නොහොත් සවාසනා සකල සංක්ලේශ ප්‍රහාණයෙන් විශුද්ධවූ, නිරවශේෂජගද්විෂයක මහාකාරුණිකත්වයෙන්හා දෙවදත්තාලවක ධනපාලාදී පරම වෛරීන් කෙරෙහිද ඌර්ජිතවූ ශ්‍රී රාහුල භද්‍රයන් කෙරෙහිදු ප්‍රතිඝානුනය වර්ජිත සමචිත්ත ප්‍රවෘත්තිමද්භාවයෙන්ද දෘෂ්ටධාර්මික සුඛවිහරණයෙහිදු පවා නිරපෙක්ෂකවූ, දවස පස්බුදුනි සක් නිමවමින් පන්සාලිස් වසක්කල් ජගද්හිතපරවශත්වයමැ අභ්‍යුපගමනය කෙළෙත් සංක්ලේශමල අපවාදමල විරහයෙන් අතිනිර්මලචරිතයක්ඇති; බුද්ධං, සර්වධර්මයන්හි අප්‍රතිහත ඥානයට නිමිත්තවූ, පවත්නා නිරුත්තර විමොක්ෂාධිගමයෙන් පරිභාවිතවූ ස්කන්ධසන්තානය, නොහොත් සර්වඥතාඥානයට පදස්ථානවූ චතුඃ සත්‍යාධිගම හෙතුයෙන් “බුද්ධ” යී උපාදය ප්‍රඥප්ති විසින් ලදනමක්ඇති උත්තම සත්ව සංඛ්‍යාතවූ සර්වඥයන්වහන්සේ; නත්වා, භය ලොභාදි විරහිත කෙවල ශුද්ධාධ්‍යාශයෙන් වැඳ; ලොකත්ථසිද්ධියා, ලෝවැඩසිදුකරණු පිණිස; සත්‍ථුනො, (භගවත්හුවිසින් අශුද්ධවූ දෙශීයමාගධීන්විනා ශුද්ධමාගධී සංඛ්‍යාතවූ මූලභාෂාවෙන්ම පය්‍යාප්තිය දෙශිතබැවින් ශ්‍රැත සම්බන්ධ වශයෙන්) ශාස්තෘහුගේ; තන්තිභාසාය, පෙළබසින්; ලොකොපකාරං, එනම් පවරුණක්; භාසිස්සං, කියමි.

2. මුනිනා සමො, බුදුන්සදෘශවූ(දිව්‍යබ්‍රහ්මාදි එකදසත්වයෙක්); මුනිනා විනා, බුදුන්හැර; තිලොකෙපි, කාමාදිලොකත්‍රයෙහි හෝ ස්වර්ග මර්ත්‍ය පාතාල යන භුවනත්‍රයෙහිම; නත්ථි, නැත්තේය; තාරාපථෙ, ආකාශයෙහි; සසඞ්කසඞ්කාසා, චන්ද්‍රයාබඳුවූ; තාරා, තරුවක්; යථා නත්ථි, යම්සේනැත්තේද; එමෙනි.

3. ජේනායෙව, බුදුබව පිණිසම; (බුදුබවපතාම); දිනාන, දෙනලද; අක්ඛි, ඇස්හා; රතන, ලේහා; මංසෙහි, මස්හා; තාරා, තාරකාද; උදධි, සාගරජලයද; භූසු, පොළොපස්ද; (යනමේ අනන්තාපරිමිතවස්තු

4. සද්ධම්මචින්තාමණිතො වඤ්චා 'නඝ්ඝතරං න හි,
තතො නු? රක්ඛසමුඛෙ පතිතො ධම්මසොණ්ඩකො.

5. භවාවට්ටෙ මහාසත්තො හුත්වා වට්ටකපොතකො,
දවග්ගිං පතිවත්තෙසි කතසච්චක්‍රියාබලො.

6. අබ්‍යත්තජනතාමජ්ඣෙ සාධුවිජ්ජාය දීපනං,
අන්ධස්සා 'දාසදානං 'ව තදානන 'මවෙක්ඛිතුං.

7. සාධූ 'සාධුජනානං හි කොපා 'කොපා න තිඨරෙ,
තිඨරෙ 'ප්‍ය 'චිරං නඤ්ඤා 'නඤ්ඤා ච තදුබ්භවා.

---

ජනයන්;) අසමාපු 'පි, නොසමවනකල්හිදු; භුවි, ලොකසන්නිවාසයෙහි; ජේනපජ්ජිකා, බුදුබව පතන්නාවූ බෝසතානන්වහන්සේලා; චිරන්තා (හොනති), ස්ථිරවූ විජ්ජාසන්තානානාත්විනයෝ වෙත්.

4. සද්ධම්ම, සත්පුරුෂ ධර්මනැමති; චින්තාමණිතො, සිතුම්ණි රුවනට වඩා; අනග්ඝතරං, අතිශයින් අනර්ඝවූ; වත්ථු, වස්තුවක්; නහි, (ලොකත්‍රයෙහිම) නැත්තේය; ධම්මසොණ්ඩකො, දහම්සොඩරජවූ මහ බෝසත්තෙම; රක්ඛසමුඛෙ, ධර්මදෙශකවූ ඉන්ද්‍රක යක්ෂනැමති රාක්ෂයා ගේ මුඛයට; පතිතො, පැන්නසේක්; තතො නු,? ඉන්වද.?

5. මහාසත්තො, අපමහබෝසතානන්වහන්සේ; භවාවට්ටෙ, සංසාර වර්තයෙහි; වට්ටකපොතකො හුත්වා, වටුපැටවෙක්ව; කතසච්චක්‍රියා බලො, කරණලද සත්‍යක්‍රියාබලඇතිසේක්; දවග්ගිං, ලැව්ගිනි; පති වත්තෙසි, (පෙරළා) ආපසුහැරීසේක.

6. අබ්‍යත්තජනතාමජ්ඣෙ, අපණ්ඩිත හෝ නුවනමදසත්වසමූහයා අතු රෙහි; සාධු, මනාවූ; විජ්ජාය, විද්‍යාවක් හෝ ශාස්ත්‍රයක්; දීපනං, ප්‍රකාශ කිරිම; අන්ධස්ස, අන්ධජනයෙක්හට හෝ නෙත්දෙකනැත්තෙනකුට; තදා නනං, ඒ අන්ධයාගේ මුහුන; අවෙක්ඛිතුං, බලන පිණිස; ආදාසදානං ඉව, කැටපතක් දෙන්නාක්මෙනි.

7. සාධුඅසාධුජනානං හි, සත්පුරුෂජනයන්ගේ හා අසත්පුරුෂජන යන්ගේත්; කොපඅකොපා, කොපයහා අකොපය හෝ අමිත්‍රබවහා මිත්‍රබව; න තිඨරෙ, බොහෝකලක් ස්ථිරව නොපවතින්; අචිරං, නො බෝකාලයක්; තිඨරෙ අපි, ඒ කොපාකොපයෝ විද්‍යමානවූවත්; තදුබ්භවා, එයින් හටගත්තාවූ; අනඤ්ඤා ච, අනාඥයෝවත්; අඤ්ඤා ච, අඥයෝවත්; නහි, නැත්තාහ.

8. ධාවං සහකොකන සොණ්ණ-හංසො ජිනි ජිනඞ්කුරො,
ජනෙනා'පි නිරවජ්ජෙසු තෙන සිජ්ඣති චින්තිතං.

9. උත්තාරෙත්වාන නදියා සො ඛො රුරු මහාධනං,
දෙසෙත්වා රාජිනො ධම්මං ලබාපෙසි සුඛා'භයං.

10. සුධාසනං සුධාසිනං රසං සබ්බරසාධිකං,
නිජ සූනූ'පසිත්තාන්න-රසං'තිවරසං තතො.

11. දාතබ්බං නිජපුත්තානං ලොකෙ'මන්දධනං පන,
සිප්පදානං'ව පුරතො ඨාතුං බ්‍යත්තසභන්තරෙ.

12. චන්දිකා චන්දනා'මන්ද සදෙව සීතලා විය,
තාතෙ'ති නිජපුත්තානං භාසිතං සීතලං භවෙ.

---

8. ජිනඞ්කුරො, බුද්ධාඞ්කුරවූ; සොණ්ණහංසො, ඒ ස්වර්ණහංසතෙම; අනෙකාන සහ, සූර්‍ය්‍යාභාසමග; ධාවං, දුවන්නේක්; ජිනි, ජයගත්තේක; නිරවජ්ජෙසු, නිරවද්‍යනයන් කෙරෙහි; ජනෙන අපි, ඉපිදවදාලාවූද; තෙන, ඒ මහබෝසතුන් විසින්; චින්තිතං, සිතාවදාරණලද්ද (සිතූසිති විල්ල); සිජ්ඣති, සිදු වේ.

9. සො ඛො රුරු, රුරුමෘගරාජන්වූ ඒ මහබෝසතානන්වහන්සේ; මහාධනං, මහාධනනම් කුමාරයා; නදියා, ගඟින්; උත්තාරෙත්වාන, ගොඩ නගා; රාජිනො, ඒ බඹදත්රජහට; ධම්මං දෙසෙත්වා; ධර්මදෙශනාකොට; සුඛාභයං, ලෞකිකලොකොත්තරසැපය හා නිර්භය; ලබාපෙසි, (දියගොඩ සතුන්ට) ලැබ්බී.

10. සුධාසිනං, දෙවියන්ගේ; සුධාසනං, අමෘතාහාරය; සබ්බරසාධිකං, සියලුරසයන්ට වඩා උතුම්වූ; රසං, රසයකි; නිජ සූනූපසිත්ත, ස්වකීය දරුවන් විසින් හැනූ; අන්නරසං, බත් බොජුන්රසය; තතො, ඒ සුධා භොජනයටත් වඩා; අතිවරසං, (මව්පියන්ට) අතිශයොත්තම්වූ රසයකි.

11. ලොකෙ, ලෙව්හි; නිජපුත්තානං, සියදරුවන්ට; දාතබ්බං, (දෙගුරුන්විසින්) දියයුතුවූ; අමන්දධනං පන, නොමඳවූ ධනයනම්; බ්‍යත්ත සභන්තරෙ, පණ්ඩිතජනසභාමධ්‍යයෙහි; පුරතො, ඉදිරියෙහි; ඨාතුං, නොපැකිල සිටීමපිණිස; සිප්පදානං එව, ශිල්පප්‍රදීමමැයි (අන්‍යධනදාන යන්ට වඩා ශිල්පදානයම උතුමැයි සිතෙයි).

12. සදෙව, ඇමකල්හිම; අමන්ද සීතලා, නොමඳසිහිල්ගුණඇති; චන්දිකා චන්දනා විය, සඳරැස්හා සඳුන්මෙන්; තාතෙ'ති, "තාත්තෙ" යි කියන්නාවූ; නිජපුත්තානං, සියදරුවන්ගේ; භාසිතං, තෙපුල; (කීම); සීතලං භවෙ, (දෙගුරුන්කරණට) ශීතලගුණයවේ.

13. ගරූපෙම්මා සුතපෙම්ම 'මධිකම්පි 'ධ රක්ඛිය,
මතො'පි සග්ගමොක්ඛස්ස දූතං පුඤ්ඤං කරොති තං.

14. සො දෙහමංසදානත්ථං සක්කවිප්පෙ සසො 'නලෙ,
පතී 'න්දුමපෙක්ඛ තං ගය්හ සක්කො තදඞ්ක 'මඞ්කයි.

15. මුනින්දගුණවෙපුල්ලං නිද්දෙසන්තෙනා 'ධ සූයතෙ,
යක්ඛභූතාභිභූතෙ තං සරතා 'පෙති භීති සා.

16. සජ්ජනා පරිහීනා'පි ඉස්සරත්තා 'ත්තනො ගුණං,
න තු ජාතු ජහන්ති 'ව භින්නා'පි සොණ්ණභාජනෙ,
විජ්ජමානග්ඝභාරාන 'මභවා'භවනං විය.

17. සන්තා 'ත්තානං 'ව නසෙන්නන්ති කතත්තචරිතෙ ජනෙ,
පදීපො පාකතදීපානං සදිසොභාසනං විය.

---

13. ගරූපෙම්මා, ගුරුසෙනහයටත් වඩා; සුතපෙම්මං, පුත්‍රප්‍රේමය; අධිකං අපි, වැඩිනමුත්; ඉධ, මෙලොවත්; රක්ඛිය, රැක; මතෙ'පි, මළ කලත්; සග්ගමොක්ඛස්ස දූතං, සග්මොක්සැපගෙණදෙන්නාවූ; තං පුඤ්ඤං, ගුරුචරණ පරිචරියාසංඛ්‍යාතවූ ඒ පිණ; කරොති, කරවි.

14. සො සසො, ඒ ශශකවූ මහබෝසත්තෙම; සක්කවිප්පෙ, ශක්‍ර නැමති බමුණාට; දෙහමංසදානත්ථං, ඇඟමස්දීමපිණිස; අනලෙ, ගිනිනට; පති, පැන්නෙයේක; සක්කො, ශක්‍රතෙම; තං, ඒ මහාසත්වයන්; ගය්හ, දෝහින්ගෙණ; තදඞ්කං, ඒ ශශලාඤ්ජනය; ඉන්දුමපෙක්ඛ, සඳ මඬලමැද; අඞ්කයී, ලකුණුකෙළේය.

15. මුනින්ද, මුනීන්ද්‍රයන්වහන්සේගේ, ගුණවෙපුල්ලං, "ඉති'පි සො" යනාදීන් වර්ණිත නවඅරහාදී බුද්ධගුණමහිමය; නිද්දෙසන්තෙන, නිදිගත්කල; ඉධ, මෙලොවදීම; සූයතෙ, හැසේ; යක්ඛභූත, යක්ෂ භූතාදි අමනුෂ්‍යයන් විසින්; අභිභූතෙ, ඔබාගත්කල්හි හෝ මැඩගත් කල්හි; තං, ඒ බුදුගුණ; සරතා, සිහිකරන්නාහුකෙරෙන්; සා භීති, ඒ යක්ෂභූත භීතිය; අපෙති, ඉවත්වේ; (අලපනදියසෙසින් පහවේ.)

16. සජ්ජනා, සාධුජනයෝ; ඉස්සරත්තා, ඉසුරුබැවින්; පරිහීනා'පි, පිරිහුනාහුද; අත්තනො ගුණං, සවකීයගුණය; ජාතු, කිසිකලෙකත්; න තු ජහන්ති එව, නොහරිත්මැයි; සොණ්ණභාජනෙ, රන්බඳුන; භින්නා'පි, බිත්කල්හිදු; විජ්ජමාන, ඇත්තාවූ; අග්ඝභාරානං, අගය භාරගුණය; අභවඅනවනං විය, අඩුනොවන්නාක්මෙනි.

17. සන්තා, සත්පුරුෂයෝ; කත, කරණලද; අත්තචරිතෙ, සවකීය චරිතයන්ඇති; ජනෙ, ජනයන්; අත්තානං ඉව, තමන්මෙන්; නසෙන්නන්ති,

18. මණිමුත්තාකඤ්චනානං ලඞා මුඞනි භූසනා,
ඤාණසිප්පගුණොපෙතා ‘පච්චලාභො ‘තිපීතිදෙ.

19. තුස්සමානා ජනා ලොකෙ සුතියා සුතිපීතියා,
නිජත්තජමුදු ‘ත්තී තෙ නාසොසාසුං නො සුණන්ති තා.

20. නිජපාදෙ ‘රිමාසීනං සාධු ‘නාසිය නායරෙ,
තිමිරාරගසිමූලෙ ‘න්ධ–කාරෙ ‘දූරිකතො විය.

21. විනොත්තමා සජ්ජනොත්තිං දුජ්ජනොත්තිං සුණන්ති නො
සුගන්ධදුග්ගන්ධඝාණෙ තුඨා ‘තුඨී ‘ව නාසිකා·

22. සනිස්සිතා ‘නෙකසතෙන නිජපාණං ‘ව රක්ඛිතං,
සතං කුතොචි නො හොති දුක්ඛමා ‘මොක්ඛදස්සනා.

---

සලකත්; පදීප, ප්‍රදීපයකින්; උපාත්ත, අච්ලාගත්; දීපානං, ප්‍රදීප යන්; සදිසඞභාසනං විය, එකාකාරව බබලන්නාක්මෙනි.

18. මණී, මැණික්ය; මුත්තා, මුතුය; කඤ්චනානං, රන්ය යනමොවුන්; ලඞා, ලැබ; මුඞනි, මස්තකයෙහි; භූසනා, පැලඳීමට වඩා; ඤාණසිප්ප ගුණො පෙත, ඥානයෙන් හා ශිල්පයෙන් හා ගුණයෙන් යුක්තවූ; අපච්ච ලාභො, දරුවන් ලැබීම; අතිපීති දෙ, අතිශයප්‍රීති දෘයකයි.

19. ලොකෙ, ලෙච්හි; සුතිපීතියා, සවන්පිනවන්නාවූ; සුතියා, ශ්‍රැති යෙන්; තුස්සමානා, සතුටුවන්නාවූ; යෙ ජනා, යම්ජනකෙනෙක්; නිජ අත්තජ, සවකීය දරුවන්ගේ; මුදුඋත්තී, මොළකැටිබස්; නාසොසාසුං, ශ්‍රවණය නොකළාහු ද; තෙ, ඒජනයෝ; තා, ඒප්‍රියශ්‍රැතීන්; නො සුණන්ති, (වෙනයමකින්) නො අසති.

20. සාධු, සජ්ජනයෝ; නිජපාදෙ, තමන්පාමුල; ආසීනං අරිං, උන්නාවූ සතුරුජනයා; අනාසිය, නොනසා; නායරෙ, රකිත්; තිමිරාරි, අන්ධකාරශත්‍රුවූ; අගසිමූලෙ, ඇගෑමුල තිබෙන්නාවූ; අන්ධකාරෙ, අඳුර; අදූරිකතො විය, දුරුනොකළාක්මෙනි.

21. උත්තමා, උතුම්ජනයෝ; සජ්ජන, සාධුජනයන්ගේ; උත්තිංවිනා, තෙපුල්මිස; දුජ්ජනොත්තිං, දුර්ජනයන්ගේ බස්; නොසුණන්ති, නො අසත්; කුමක්මෙන්දයත්? සුගන්ධදුග්ගන්ධඝාණෙ, මනානොමනාගන්ධ ඝ්‍රාණයෙහි; තුඨාතුඨී, සතුටුනොසතුටුවූ; නාසිකා ඉව, නාසාවමෙනි.

22. සනිස්සිත, තමන්සේවකවූ; අනෙකසතෙන, නොයෙක් ජනයන්; නිජපාණං ඉව, සියපණමෙන්; රක්ඛිතං, රකින්නාවූ; සතං, සත්පුරුෂයන්ට; ආමොක්ඛදස්සනා, නිවන්දක්නාතෙක්; දුක්ඛං කායි කාදිදුකක්; කුතොචි, කොයිනුත්; (කිසිඅතකිනුත්); නො හොති; නොවේ.

23. සබ්බසාතා'ධිකං සාතං ජාන සජ්ජනදස්සනං,
තතො 'ධිකතරං සාත 'මසාධූන 'මදස්සනං.

24. අත්ථසිද්ධිං නිද්ධනීන 'මිධා 'ලද්ධා ජනුත්තමා,
කරොන්ති ලාභං සුඵල-භරිතා විය පාදපා.

25. ජනාන 'මත්ථො මච්ඡෙර-ජනත්ථො සාධුහත්ථගො,
මෙඝාවුත 'ණ්ණවවනං ජනාන 'මමතායතෙ.

26. නිද්දුක්ඛෙන 'ඛිලෙස්සරියං නො ලභෙය්‍යුම්පි ඤාණිනො,
පරඝාතෙන තං ලද්ධං සල්ලක්ඛෙන්තිවජ්ඣකං විය.

27. ගරූඤාතී පුත්තදාරෙ රක්ඛමානෙ 'ධ සජ්ජනා,
ලභන්ති කිත්තිං කන්තඤ්ච සග්ගමොක්ඛං පරත්ථ ච.

---

23. සජ්ජනදස්සනං, උත්තමජනයන්දක්ම; සබ්බසාතාධිකං, සියලු සැපයට වැඩිවූ; සාතං, සැපයෙකි; අසාධූනං, ගුණහීනයන්; අදස්සනං, නොදක්ම; තතොධිකතරං, ඒ සාධූන්දක්මටත් වැඩිවූ; සාතං, සැපයෙකැයි; ජාන, දැනගන්න.

24. ඉධ, මේලොකයෙහි; උත්තමා ජනා, උතුම්ජනයෝ; ලාභං අලද්ධා, අනුන්ගෙන්අයනොලැබගෙණ; නිද්ධනීනං, ධනහීනයන්ටත්; අත්ථසිද්ධිං, හිතසාධනය; කරොන්ති, කරත්; කුමක්මෙන්දයත් ? සුඵලභරිතා, මධුරඵලභාරයෙන්භරිතවූ; පාදපා විය, වෘක්ෂයන්මෙනි.

25. මච්ඡෙරජනඅත්ථො, මසුරුජනයාගේ ධනයතෙම; සාධුහත්ථගො, උත්තමජනයන් අතට පැමිණියේ; ජනානං, සියලුජනයන්ට; අත්ථො, ප්‍රයොජන වේ; (වැඩවේ); අණ්ණවවනං, සමුද්‍රලවණජලය; මෙඝාවුතං, මෙඝයට හසුවූයේ; (නොහොත්) මෙඝාවුත, මේඝාවෘතවූ; අණ්ණවවනං, සමුද්‍රජලය; ජනානං, ලොකවාසීසත්වයන්ට; අමතායතෙ, අමාවක්මෙන් මිහිරි වේ.

26. ඤාණිනො, නුවනැතිජනයෝ; නිද්දුක්ඛෙන, නිදුකින්; (නිරායාශයෙන්;) අඛිලෙස්සරියං, සකලෛශ්වය්‍ය්‍යය; නො ලභෙය්‍යුම්පි, නොලබත් නාහුද; පරඝාතෙන, මෙරමාවෙහෙසීමෙන්; ලද්ධං, ලබනලද; තං, ඒ ඓශ්වය්‍ය්‍යය; ජකං විය, වධ්‍යස්මෙන්; (මලෙලසිත්;) සල්ලක්ඛෙන්ති, සලකත්.

27. ගරූ, ගුරුන්හා දෙගුරුන්ද; ඤාතී, බන්ධූන්ද; පුත්තදාරෙ, පුතඹුවන්ද; රක්ඛමානා, රකින්නාවූ; සජ්ජනා, සාධුජනයෝ; ඉධ, මේලොකයෙහි; කිත්තිඤ්ච, කීර්තියද; කන්තඤ්ච, මනොඥදෙයද; ලභන්ති, ලබත්; පරත්ථ, පරලොවිහි; සග්ගමොක්ඛං, ස්වර්ගයහාමොක්ෂයද; (ලභන්ති, ලබත්;).

28. සන්තා වසන්තා'පි ඤාණී සද්ධිං මක්ඛිජනෙහි තෙ,
න ජහන්ති ගුණං සාධුං මධු නිම්බෙ 'ව බන්ධිතං.

29. ජානන්තා සජ්ජනා ඤාණී කතකාරස්ස සබ්බචං,
නරකප්පෙන කප්පාගා 'ගමෙමව ජනතාණකා.

30. සුඛදුක්ඛං කිත්තකම්පි භවෙ නෙ 'ඤ්ජන්ති ඤාණිනො,
චණ්ඩ මාරුතවෙගෙන පහටො 'වා 'චලා 'චලො.

31. වදති'සං සත්තුදෙසං පස්සන්තං දෙසමත්තතො,
ජාතු කෙසග්ගමත්තා 'ඝං න හොත්‍යුභයලොකතො.

32. වදතො හො භවන්ත්‍යත්ථා ගුණ ඤාණග්ග පාණිනං,
ඤාණප්පමාණතො මෙ'තො ගුණෙ දීපෙමි සාධුනං.

---

28. මක්ඛිජනෙහි සද්ධිං, ගුණමකුජනයන්සමග; වසන්තා'පි, වසන්නාවූද; (ජිවත්වන්නාවූද;) ඤාණී, නුවනැති; තෙ සන්තා, ඒසජ්ජනයෝ; සාධුං ගුණං, ඔවුන්තුළපිහිටිමනාගුණය; න ජහන්ති, නොහරිත්; කුමක්මෙන්දයත් ? නිම්බෙ, කොසඹතුරෙහි; බන්ධිතං, බඳිනලද; මධු ඉව, මීය හෝ මධුපටලය මෙනි.

29. කතකාරස්ස, කළසත්කාරගුණයත්; සබ්බචං, කියනලදමනාබසත්; ජානන්තා, දන්නාවූ; ඤාණී, නුවනැති; සජ්ජනා, සුදනෝ; නරකප්පෙන, මනුෂ්‍යකල්පයෙන්; ආගම්ම, අවුත්; ජනතාණකා, සත්ත්වාරක්ෂණය කරන්නාවූ; කප්පාගා ඉව, කල්පවෘක්ෂයන් හෝ සුරද්‍රුමයන්මෙනි.

30. සුඛදුක්ඛං, සැපදුක්; කිත්තකම්පි භවෙ, කොපමණඋවත්; ඤාණිනො, ඥානවන්තයෝ; න ඉඤ්ජන්ති, නොසැලෙත්; (කම්පානොවෙත්;) කුමක්මෙන්දයත් ? චණ්ඩ, සැඩවූ හෝ දැඩිවූ; මාරුතවෙගෙන, පවන්වෙගින්; පහටො, ප්‍රහාරලත්; අචලො, නිශ්චලවූ; අචලො ඉව, පර්වතයක් මෙනි.

31. සත්තු, සතුරාගේ; ඊසං දෙසං, මඳවරදත්; වදති, ලෝවැසිතෙම කියයි; අත්තනො දෙසං, සවකීය දෙෂය; පස්සන්තං, දක්නා ජනයාහට; ජාතු, කිසිකලෙකත්; කෙසග්ගමත්තා'ඝං, කෙසගක් විතරත් දුකක්; උභයලොකතො, දෙලොවින්; න හොති, නොවේ.

32. හො, භවත්නි; අග්ගපාණිනං, උත්තමජනයන්ගේ; ගුණඤාණෙ, ගුණ නුවන; වදතො, නොමසුරුව කියන්නාහට; අත්ථා, උභයලොකාර්ථයෝ; භවන්ති, වෙත්; නොහොත් තමහට පැමිණෙත්; අතො, එහෙයින්; මෙ, මාගේ; ඤාණප්පමාණතො, නැණපමණින්; සාධුනං ගුණෙ, (ඒ) සත්පුරුෂගුණයන්; දීපෙමි, පවසමි.

33. සොණ්ණපත්තෙ යථා'සිත්ත සීහතෙලං න හීයතෙ,
මෙත්තාදයා සතං චිත්තෙ පුණ්ණා වත්තන්ත්‍යහීනකා.

34. පරදුක්ඛෙ පතිට්ඨෙන්ති සාධූ ධනී'පි නිද්ධනා,
වීජන්‍ය'පවනා ගිම්හං ජහත්‍යා'හුයිවා'නිලං.

35. සුඛප්පදෙසෙ'ව සදුණී වසන්තොප්‍යරිසු'භතො,
වීතික්කමන්ති ජිව්හෙ'ව බත්තිංසද සනන්තරෙ.

36. සරතං යෙහි විහිතං හිතං නත්ථ්‍ය'හිතං භුවි,
දුට්ඨජනකතං දුට්ඨමචිත්තට්ඨං'ව ලට්ඨකං.

37. ලොකෙ'නෙකඛෙත්තවත්ථා 'ගාරක්ඛකජනො යථා,
ජනාසඞ්ගිමෙහා'රුවච්ඡායා සිරි සජ්ජනපාණිගා.

---

33. සොණ්ණපත්තෙ, රත්බඳුනෙහි; ආසිත්ත, වත්කරණලද; සීහතෙලං, සිංහතෛලය; යථානහීයතෙ, යම්සේනොපිරිහි (අඩුනොව) පවතීද; (එමෙන්ම) සතංචිත්තෙ, උතුමන්ගේ සිතෙහි; මෙත්තාදයා, ක්ෂමානුකම්පා ගුණයෝ; පුණ්ණා, පරිපූර්ණව; අහීනකා, අඩුනොව; වත්තන්ති, පවතිත්.

34. සාධූ, උත්තමයෝ; ධනී'පි, වස්තුඇතිවත්; නිද්ධනා'පි, වස්තු නැතිවත්; පරදුක්ඛෙ, මෙරමාව්‍යසනයෙහි; පතිට්ඨෙන්ති, පිහිටවෙත්; අපවනා, පවන් නැත්තාවූ; වීජනි, තල්වැට; අනිලං ආහුය, පවන් ගෙන්වා; ගිම්හං ජහති ඉව, යම්සේගිමන්දුරුකරයිද එමෙනි.

35. අරිසු, සතුරන්; උභතො, දෙපස; වසන්තොපි, වසත්ම; සදුණී, නැණැතියෝ; සුඛප්පදෙසෙව, සැප පෙදෙස්හිම; වීතික්කමන්ති, දව සරිත්; කෙසේදයත්; බත්තිංස දසනන්තරෙ, දෙතිස් දත්ඇට අතරෙහි නොතැළී දවස්යවන; ජිව්හා ඉව, දිවමෙනි.

36. යෙහි, යමෙකුන් විසින්; විහිතං හිතං, කරණලද ඉෂ්ටසාධනය; සරතං, සිහිකරන්නන්ට; භුවි, ලොකයෙහි; අහිතං, අපථ්‍යක්හෝ අවැඩක්; නත්ථි, නැත; දුට්ඨජනකතං, නපුරුජනයා විසින්කරණලද; දුට්ඨං, නපුර; අචිත්තට්ඨං'ව, සිතෙහි නොපිහිටියේම; ලට්ඨකං, මැනවි.

37. ලොකෙ, ලෙව්හි; අනෙක, නොයෙක්; ඛෙත්ත, කෙත්හා; වත්ථු, වත්හා; අග, රුක්ෂ යනමොවුන්; ආරක්ඛක, පාලනය කරන්නාවූ; ජනා යථා, මනුෂ්‍ය සෙයින්; සජ්ජනපාණිගා, සත්පුරුෂයන් අතට පැමිණියාවූ; සිරි, සම්පත්තිතොමෝ; ජනාසඞ්ගිම්හ, ජනයන්ගේදක්නැමහි ගිමට; උරුවච්ඡායා, මහත්වූසෙවනකි; මහත්වූසැනසිල්ලකියි සේයි.

38. වුඩ්ඪබ්‍යාධිතදුබ්බලන්ධ-දීනසප්පුරිසෙසිනං,
පතිට්ඨා වෙ ඨපෙත්වාන නත්‍ථ'ඤ්ඤා භුවි භූපතී.

39. සම්පත්තිමදමත්තස්ස ලද්ධානන්තධනස්ස 'පි,
පූරීයතෙ නෙව චිත්ත'මම්බුධී'ව මහම්බුනා.

40. පාපයං යං ජනං ඨානං ගුණඤ්ඤුණෙන බුද්ධිමා,
විනා දිනින්ද 'මින්දෙන සො'න්දුමජ්ඣෙ සස'ඞ්කිතො.

41. අත්‍ථෙ'ඤ්ඤත්තාය පාපෙන්තො ඵලිතාගෙහි 'වා'ම්බුදෙ,
සන්තොහි පත්තසම්පත්ති සා'ත්‍ථිකා'ඛිලදෙහිනං.

42. බාලෙ ගහෙත්වා සිජ්ඣන්ත'මත්‍ථං සාධෙති බුද්ධිමා,
යථි'ක්ඛණ'මයොදසෙ වත්තස්සා'මන්දකම්බුනො.

---

38. වුඩ්ඪ, වෘද්ධයා; බ්‍යාධිත, ව්‍යාධිතය; දුබ්බල, දුර්වලයා; අන්ධ, අන්ධය; දීන, බැගෑය; සප්පුරිස, සත්පුරුෂය; ඉසීනං, තාපසය යන මොවුන්ට; භුවි, ලෙව්හි; භූපතී ඨපෙත්වාන, රජුන් හැර; අඤ්ඤා පතිට්ඨා, අන්පිහිටක්; වෙ, එකාන්තයෙන්; නත්‍ථි, නැත.

39. ලද්ධ, ලබනලද; අනන්තධනස්ස'පි, අප්‍රමාණධනඇති; සම්පත්ති මද, ඉසුරු මදයෙන්; මත්තස්ස, මත්වූජනයාගේ; චිත්තං, සිත; නෙව පූරීයතෙ, නොපිරේ; මහම්බුනා, මහ වතුරෙන් නොපිරෙන්නාවූ; අම්බුධිඉව, සමුදුරමෙනි.

40. බුද්ධිමා, නුවණැත්තෙනක්; යං ජනං, යම් ජනයෙකු; ඨානං, පුදුසු තැනකට; පාපයං, පමුණුවන්නේ; ගුණඤ්ඤුණෙන, ගුණදැනීමෙනි, (ඒ එසේමැයි;) ඉන්දෙන, ගුණදන්නාවූ ශක්‍රයා විසින්; දිනින්දං විනා, හිරුහැර; ඉන්දුමජ්ඣෙ, සඳමැද; සො සසො, ඒ ශශකවූ බෝසත් තෙම; අඞ්කිතො, විහගිතයි.

41. අම්බුදෙ, මෙඝයතෙම; ඵලිතඅගෙහි, ඵලතුරින්; අඤ්ඤත්තාය, අන්හටම; අත්‍ථෙ, අර්ථයන්; පාපෙන්තො ඉව, පමුණුවන්නාක් මෙන්; සන්තොහි, සුදනන්විසින්; පත්තසම්පත්ති, ලදඉසුර; අඛිලදෙහිනං, හැමසත්නට; සාත්‍ථිකා, වනාවැඩවේ. (නොහොත්) අර්ථසහිත වන්නීය.

42. බාලෙ ගහෙත්වා, හීනයන් රැගෙණ; සිජ්ඣන්තමත්‍ථං, සිදුවන වැඩ; බුද්ධිමා, නුවණැතිජනතෙම; සාධෙති, සිදුකරයි; අමන්ද කම්බුනො, බොහෝ රත්රන් ඇත්තෙකු; අයොදසෙ, යකැටපත්හි; වත්තස්ස, මුහුණ; ඉක්ඛණං යථා, බැලීම මෙනි.

43 එකො සමණො එකස්ස අඤ්ඤො ‘ඤ්ඤස්ස ‘තථෙවහි,
න සමුද්දෙ රථො යාති තථෙව තරණී ථලෙ.

44. ඵලිතාඞ්ගො ගාමමජ්ඣෙ යථා‘ත්ථො සබ්බපාණිනං,
සම්පන්නි සන්තසම්පත්තා සබ්බසත්තා‘භිවුඩ්ඪියා.

45. සාධු තදත්ථං සාධෙන්ති අසාධුහි ‘පි හිංසිතා,
චන්දනවජ්ජිතනාථරසු–ධාරා විය සුගන්ධිතා.

46. පී ඵඩ්ගුණවන්තී‘පි දීපෙන්ති සිතසීතලං,
ඵඩ්ඩපි වා‘යසා ‘මන්තං දීපෙන්ත‘මිව සීතලං.

47. නිජත්ථිං රක්ඛසො රක්ඛි ගබ්භා‘ක්ඛිප්ප කරණ්ඩකෙ,
සිඩ්ඩස්සා‘නො‘ධිකප්පෙම‘මකා සා සකසාමිනො.

---

43. එකො, එකෙක්; එකස්ස, එක්වැඩකට; සමණො, පොහොසති; තථෙව, එලෙසින්ම; අඤ්ඤො, අනිකෙක්; අඤ්ඤස්ස, අනිකකට (සමති); හි, ඒඑසේමැයි. සමුද්දෙ, සමුද්‍රයෙහි; රථො, ගැල හෝ රිය; න යාති, නොයයි; ථලෙ, ගොඩ; තරණී, නැව, තථෙව, එසේම නොයයි.

44. ගාමමජ්ඣෙ, ගම්මැද්දෙහිවූ; ඵලිතාඞ්ගො, පලබරවූරුකෙක්; සබ්බපාණිනං, හැමසතුන්ට; යථා අත්ථො, යම්සේ ප්‍රයොජනද; (එසේ) සන්තසම්පත්තා, සාධුන්විසින් ලබනලද්දවූ ; සම්පන්නි, සැපත ; සබ්බ සත්තාභිවුඩ්ඪියා, සියලු සත්වයන්ගේ අභිවෘද්ධිය පිණිස වේ.

45. අසාධුහි, අධමයන්විසින්; හිංසිතාපි, බාධිතවූත්; සාධු, උත්තමයෝ; තදත්ථං, ඔවුන්පිළිබඳවැඩ; (ඒඅසාධුන්ටහිතක්‍රියා); සාධෙන්ති, සාදති; චන්දනවජ්ජිතන, සඳුන්කැපූ; ඵරසුධාරා, කෙටේරිමුවාත; සුගන්ධිතා විය, සුවඳවූවාක්මෙනි.

46. පී, සත්පුරු; ඵඩ්ගුණවන්තී අපි, තද ගුණැත්තියෝ නමුත්; සිත සීතලං, මන්දහාස්‍ය සීතලය; දීපෙන්ති, පහළකෙරෙත්; කුමක් මෙන් දැයත්? ආයසා මන්තං, යමුවාබඳන; ඵඩ්ඩපි ව, තදනමුදු; සීතලං, සිහිල්බව; දීපෙන්තං ඉව, ප්‍රකාශකරන්නාක්මෙනි.

47. රක්ඛසො, රකුසෙක්; නිජත්ථිං, තමන්ලිය; කරණ්ඩකෙ, කරඬුවෙක්හි හෝ සුමුගෙක්හි; ඛක්ඛිප්ප, බහා; (දමා:) ගබ්භා, ගැබින්; රක්ඛි, රැක්කේය; සා, ඒසත්‍රීතොමෝ; සිඩ්ඩස්ස, ඒගැබ්තුළට පිවිසි සිඩයෙකුට; අනො සකසාමිනො, ඒ සියහිමි රකුසාටත් වඩා; අධිකපෙමං, අධික සිනාහය; අකා, කළාය.

48. සායං'යථා චකොරානං ථීනං සන්තුට්ඨමානසං,
සා කාමනමනොකුන්ද-කානනස්ස සුවඤ්ජිකා.

49. රූපලක්ඛ්‍යාමලගුණසිරිතෙජොපරක්කමී,
උපෙච්ච දළ්හාරක්ඛා 'පි චින්තිතං 'ව කරොන්ති ථී.

50. ජිතසොණ්ණලතාරූපස්සිර'ත්ථි බ්‍රහ්මනිම්මිතා,
හිත්වා ගුණෙ 'පි 'ත්ථිචිත්තෙ මහතිං සිල'මත්ථරි.

51. විජාතාය'ත්ථියා වා'පි පෙමං සච්චමකත්ථ මා,
ගුත්තාවිසො 'ව කීළන්තො මණිනා භූසිතො'ප්‍යහි.

52. ගෙහභණ්ඩං නීහරිත්වා'හිණ්ඩන්තීහි තහිං තහිං,
තාහි ජාරීහි අත්ථි 'පි අත්ථා'සා'සං කරෙථ මා.

---

48. සායං, දිනාන්තයෙහි; චකොරානං, සියුරන්හට; සා සුවඤ්ජිකා, ඒ මනාසඳකැල්ම; යථා, යම්සේද; ථීනං, ස්ත්‍රීන්ගේ; සන්තුට්ඨමානසං, සතුටුසිත; කාමන, කාමීන්ගේ; මනො, සිත්නැමති; කුන්දකානනස්ස, කොඳවනයට; ('තථා' යි අධ්‍යාහාරයි) එබඳුම වේ.

49. රූපලක්ඛී, රූපශ්‍රීයද; අමලගුණ, නිර්මලගුණයද; සිරි, සම්පත්තියද; තෙජො, තෙජසද; පරක්කමී, පරාක්‍රමයද ඇත්තන්කරා; උපෙච්ච, එළඹත්; දළ්හාරක්ඛා'පි, බලවත්රැකවල්ඇතිවත්; ථී, ස්ත්‍රීහු; චින්තිතං'ව, සිතුවක්ම; කරොන්ති, කෙරෙත්.

50. බ්‍රහ්මනිම්මිතා, බඹහුවිසින් මවනලද්දාවූ; ජිතසොණ්ණලතා, දිනූ රන්ලියඇති; රූපස්සිරි, රූපශ්‍රීයක්; අත්ථි අපි, ඇතිනමුත්; ගුණෙ, සියලු කල්‍යාණගුණයන්; හිත්වා, පියා; ථීචිත්තෙ, මාගමුන්සිත්හි; මහතිං, මහත්වූ; සිලං, ගලක්; අත්ථරි, (ඒබ්‍රහ්මතෙම) අතුළේසි.

51. විජාතාය වා'පි, දරුවන්වැදූවාවූද; ඉත්ථියා, මාගමගේ; පෙමං, සෙනහස; මා සච්චං අකත්ථ, සැබෑනොගණිව්; මණිනා, නාගමාණික්‍යයෙන්; භූසිතො'පි, සරසනලදුවත්; ගුත්තාවිසො, සැඟෙව් විෂ ඇතිවූ; කීළන්තො, නටන්නාවූ; අහි ඉව, නයෙක් වැනිය.

52. ගෙහභණ්ඩං, ගෙයිබඩු; නීහරිත්වා, බැහැරකොට දී; තහිං තහිං, තැන්තැන්වලනෝ (ඒ ඒ තැන); ආහිණ්ඩන්තීහි, ඇවිදුනාවූ; තාහි ජාරීහි, ඒ නොපණත් කම්කරන්නියන්ගෙන් වන්නාවූ; අත්ථා, ප්‍රයොජනයෝ; අත්ථි අපි, ඇතත්; ආසු, ඇලාකෙරෙයි; ආසං, ආලය; මා කරෙථ, නොකරවු.

53. වසන්තී කුලටා රුද්ධා නො ’ත්තනො ඡන්දතෙ යථා,
තායො ජහාති සූපම්හි ලොහං ලොණාධිකෙ විය.

54. නිලීයනං න ලජ්ජාය කාමී දිස්වාන නාරිනං,
ආමිසස්සා’කරප්පත්ති’මොතූනං’ව නිලීයනං.

55. පීනං විධාය’වරණං ධරන්තා ’මෙධිනො යථා,
වපිත්වා වාපියං බීජෙ පිජානං වතිබන්ධකා.

56. නිජසීල’මජානන්තා පරත්ථිපත්ථිකා සුරං,
පීත්වා ’මතන්ති’වදුක්ඛං විඳන්තා’ත්ථ පරත්ථ ච.

57. සඞ්ඛාටං සගහමොක්ඛාය නරකාය මහඤ්ජසං,
මායාපුණ්ණං භාජනං ච විසමිස්සාමතං පියො.

---

53. අත්තනො, තමාහිනට; යථා නො ඡන්දතෙ, යම්සේ නොහැඟේද; (එසේ) වසන්තී, ජීවත්වන්නාවූ; රුද්ධා, රෞද්‍රවූ; කුලටා, ධූර්තවූ; තායො, ඒස්ත්‍රීන්; ලොණාධිකෙ, ලවණාධිකවූ; සූපම්හි, සූපයෙහි; ලොහං විය, ආශාව අත්හරින්නාසේ; ජහාති, දුරුකරව්.

54. කාමී දිස්වාන, කාමීන්ද්‍රක; නාරීනං, අඟනන්ගේ; නිලීයනං, සැඟවීම (හෝ හැන්ගීම); න ලජ්ජාය, විළියෙන් නොවේ; ආමිසස්ස, ගොදුර; ආකරප්පත්තිං, අතට පත්වනතෙක්; ඔතූනං, බළලුන්ගේ, නිලීයනං ඉව, හැන්ගීම මෙනි.

55. පීනං, ස්ත්‍රීන්ට; ආවරණං විධාය, රැකවල්කොට; ධරන්තා; ජීවත්වන්නාවූ; අමෙධිනො, අඥනජනයෝ; වාපියං, වැවෙක්හි; බීජෙ වපිත්වා, බිජු වපුට; පිජානං, පක්ෂීන්ගේ ප්‍රවේශාවරණය පිණිස; වතිබන්ධකා යථා, වැටබඳින්නවුන්වැන්නෝයි.

56. නිජසීලං, ස්වකීයස්වභාව; අජානන්තා, නොදනිමින්; පරත්ථි පත්ථිකා, පරස්ත්‍රීන්පතනජනයෝ; සුරං, රා; අමතං ඉති, අමායයි; පීත්වා, බී; අත්ථ ච, මෙලොවත්; පරත්ථ ච, පරලොවත්; දුක්ඛං විඳන්තා ඉව, දුක් විඳින්නවුන් වැන්නාහුයි.

57. පියො, ස්ත්‍රීහු; සගහමොක්ඛාය, සගමොක්ෂයනම්ගට; සඞ්ඛාටං, අකුලකි; නරකාය, නරකයටයන; මහඤ්ජසං, මහමගෙකි; මායාපුණ්ණං, මායාපිරූ; භාජනං ච, බඳුනකි; විසමිස්ස, විෂමිශ්‍රවූ; අමතං, අමාවෙකි.

58. ථීපෙමබන්ධනං පත්වා'බ්‍යත්තානං දුක්ඛවින්දනං,
මොරිං පටිච්ච සොවණ්ණ-මොරස්ස විය බන්ධනං.

59. පෙමං පරෙසු බන්ධන්තී හිත්වා චොරී සසාමිනං,
ඛාදිත්වාන'ඛාදනීයං මංසං වංසං'ව නාසකා.

60 ථීසෙවකජනා'මන්ද-දුක්ඛං වින්දන්ති නින්දිතෙ,
පභාවත්‍යාසාය කුසො රාජා කාජෙ සමුබ්බහි.

61. මිච්ඡාපෙමවතී නාරී ජාරෙ'දාය ධවං වධෙ,
කොණ්ඩච්ඡා'ය මහාසත්තං සෙලෙ'ව පාතිතා'බලා.

62. ගුණඤ්ඤූණාතපපවතී-පවිඩොකං පවඩ්ඪති,
නිවිඩොකං නිග්ගුණාති සිරිපුණ්ණමපි හායති.

---

58. ථීපෙමබන්ධනං, ස්ත්‍රීන්ට පෙම්බැඳුමට; පත්වා, පැමිණ; අබ්‍යත්තානං, අවිදුන්ගේ; දුක්ඛවින්දනං, තිරිනැරවිඳීම; මොරිං පටිච්ච, සෙබඩක් නිසා; සොවණ්ණමොරස්ස, බෝසත්රණමොණරුට වූ; බන්ධනං විය, මලපත්හි බැඳීම මෙනි.

59. සසාමිනං, තමහිමියා; හිත්වා, හැරදමා; පරෙසු, අනුන්කෙරෙහි; පෙමී බන්ධන්තී, පෙම් බඳින්නාවූ; චොරී, චෞරස්ත්‍රීතොමෝ (හෙර); අඛාදනීයං මංසං, නොකැයුතුමස්; ඛාදිත්වාන, කා; වංසං නාසකා ඉව, කුලය නසන්නියක්මෙනි.

60. ථීසෙවකජනා, ස්ත්‍රීන්නිසාවසන ජනයෝ; නින්දිතෙ, නින්දිතවූ හෝ පිළිකුල්වූ; අමන්දදුක්ඛං, නොමදදුක්; වින්දන්ති, විඳිත්; කෙසේ දයත්? පභාවත්‍යාසාය, ප්‍රභාවතීන්ට කළ ආලයෙන්; කුසො රාජා, කුසරජන්වූ මහබෝසත්තෙම; කාජෙ, වඩුත්කත්; සමුබ්බහි, ඇද්දේහෝ ඉසුලූයේය.

61. මිච්ඡාපෙමවතී, අසත්‍යප්‍රෙමයඇති; නාරී, ස්ත්‍රීතොමෝ; ජාරෙ ආදාය, හොරහිමියන්රැගෙණ; ධවං, සියහිමියා; වධෙ, නසන්නීය; කොණ්ඩච්ඡාය, අත්පාසුත්කොටකුසදහා; මහාසත්තං; මහබෝසතුන්; සෙලා, ශෛලයෙන්; පාතිතා, හෙලූ; අබලා ඉව, අඟනමෙනි.

62. ගුණ, ගුණයහා; ඤූණ, නුවණහා; ආතපපවති, වීයසීවත්ස්ත්‍රීන්; පවිඩොකං, පිම්පිගෙය; පවඩ්ඪති, ප්‍රකාශියෙන්හෝ අභිශසිත්වැඩේ; නිග්ගුණාති, අවගුණස්ත්‍රීන්; නිවිඩොකං, නැවතුනගෙය; සිරිපුණ්ණං අපි, සකලෛශ්වර්‍යයෙන් පිරුණේද; හායති, පිරිහේ.

63. කත්වා නිජත්ථිං පමාණං වසන්තා ‘විද්දසුනො භුවි,
විසඝොරො’රගං ගීවෙ කීළාපෙන්තො’ව වෙසිය.

64. නිජපාණං’ව පතිනා ගොපිතා වනිතා ‘පි ච,
එස්සං වික්කායභණ්ඩං’ව දෙන්ත්‍ය’ව යස්ස කස්සචි.

65. මිච්ඡාමායම්පි පී කත්වා සච්චං කුබ්බන්ති වා’ලිකං,
ජාරෙ භුත්වාන යං දෙන්ති තදාදයෙ’න්ති තබ්බසං.

66. සම්පාදිතං පනෙ’කෙන භොජෙන්ත්‍යා’දාය පී ‘පරං,
ඛාදන්තා විය කාකාදී මිගින්දහතදන්තිනං.

67. දිඨවච්චය’මසච්චන්ති වසන්තී’රෙන්ති බාහිරෙ,
හිත්වා විසං තං භූනාරී නාරි’මෙකං ගිලි පුරෙ.

---

63. නිජත්ථිං, ස්වකීයස්ත්‍රිය; පමාණං කත්වා, ප්‍රමාණකොට; වසන්තා, ජීවත්වන්නාවූ; අවිද්දසුනො, අඥානජනයෝ; භුවි, ලොකයෙහි; විසඝොරොරගං, විෂඝොරසර්පයකු; ගීවෙ, ගෙලෙහි; වෙසිය, වෙලාගෙණ; කීළාපෙන්තා ඉව, කෙළවන්නන්මෙනි.

64. නිජපාණං’ව, සිය්‍යපණමෙන්; පතිනා, හිමියාවිසින්; ගොපිතා ‘පි ච, රැකිනමුත්; වනිතා, ස්ත්‍රීහු; එස්සං, පහස; වික්කායභණ්ඩං ඉව, විකිණීබඩුවක්මෙන්; යස්ස කස්සචි, යම්කිසිවෙක්හට; දෙන්ති එව, දෙත්නාහුමැයි.

65. පී, ස්ත්‍රීහූ; මිච්ඡාමායං අපි, අසත්‍යවූමායම්ද; කත්වා, කොට; අලිකං ච, බොරුවත්; සච්චං කුබ්බන්ති, සැබෑකරත්; ජාරෙ, හොර හිමියා; භුත්වාන, කා; (අනුභවකොට;) යං, යමක්; දෙන්ති, දේද; තං ආදාය, එයරැගෙණ; තබ්බසං, ඔහුවසගයට; එන්ති, පැමිණෙත්.

66. එකෙන පන, එකෙකුවිසින් වනාහි; සම්පාදිතං, සපයනලද දෙය; ආදාය, රැගෙණ; අපරං, අනිකෙකු; භොජෙන්ති, වළඳවත්නාවූ; පී, ස්ත්‍රීහු; මිගින්ද හතදන්තිනං, මිගිඳුන්නැසූගිජිඳුන්; ඛාදන්තා, කන්නාවූ; කාකාදී විය, කවුඩු කුලලාදීන්මෙනි.

67. දිඨඅවච්චයං, දුටුවරද; අසච්චං ඉති, අසත්‍යයයි; බාහිරෙ වසන්තී, බැහැරවසනස්ත්‍රීහු; ඊරෙන්ති, කියත්; තං විසං, ඒබොරුනැමතිවිෂය; හිත්වා, හැර; භූනාරී, මිහිකත; පුරෙ, පෙර; එකං නාරිං, එක්ස්ත්‍රියක්; ගිලි, ගිලගත්තීය.

68. දීපෙත්‍වාපි පෙමපටුතා-ගුණසදුණෙ ජනෙ මනෙ,
මා මතායා'මතායා 'පි දීපෙථ භරියාය තෙ.

69. සිරිමන්තීකතා 'පී 'ත්‍ථී තුච්ඡසවාසං කරොන්ති හි,
පායසං මධුරං හිත්‍වා පත්‍ථෙන්තෙ'වා 'සුචිං සුනා.

70. නාසෙන්ති'ත්‍ථී සිරිවජ්ඣාය ලොකත්‍ථසිද්ධිසාධකෙ,
කාලිදාසකවිං හන්ත්‍වා නාරී රජ්ජඤ්ච නාසයී.

71. තරුතො ලතා පල්ලවිතා'ලිඞ්ගියා'කඞ්ඛියා'පරෙ,
තුණ්ඩං නිච්චං යථා දෙති දිඬිදිභෙ තථා වධූ.

72. සුරං ථෙය්‍යෙන පිබතං තම්මදෙ පාතුභෙස්සති,
නාරීකතං චොරකම්මං සසඞ්කා විය දිස්සතෙ.

---

68. ජනෙ මනෙ, ජනයාමළකල්හි; පෙම, ප්‍රෙමයද; පටුතා, සාමර්ථ්‍ය යද; ගුණසදුණෙ, ගුණානුවණද; දීපෙතාහි, ලෝවැස්සෝ ඤාතය කරත්; භරියාය, සියබිරින්ද; මතාය'පි, මළකලත්; අමතාය'පි, නොමළකලත්; තෙ, ඒ ප්‍රේමාදීගුණයන්; මා දීපෙථ, නොකියව්.

69. ඉත්‍ථී, ස්ත්‍රීහු; සිරිමන්තී කතා 'පි, ශ්‍රීමත් කරණලදනුමුත්; තුච්ඡසු, නිෂ්ඵලත්කෙරෙති; ආසං, ආලය; කරොන්ති හි, කෙරෙත් මැයි; මධුරං, මිහිරිවූ; පායසං, කිරිබත; හිත්‍වා, හැර; අසුචිං පත්‍ථෙන්තා අමෙධ්‍යය කැමතිවන්නාවූ; සුනා ඉව, සුනඛයන්මෙනි.

70. ඉත්‍ථී, ස්ත්‍රීහු; සිරිඉච්ඡාය, ඓශ්වර්‍ය්‍යාභිලාෂාවෙන්; ලොකත්‍ථසිද්ධි සාධකෙ, ලෝවැඩසිදුකරණජනයන්; නාසෙන්ති, නසත්; නාරී, ස්ත්‍රියක්; කාලිදාසකවිං, කාලිදාසනම්කිවීන්; හන්ත්‍වා, නසා; (පුන), නැවත; රජ්ජං ච, කුමාරදාසරජ්ජුන්ද; නාසයී, නැසීය.

71. තරුතො, තුරින්; පල්ලවිතා ලතා, ලියලනලද ශාඛාතොමෝ; අපරෙ, අන්‍යවෘක්‍ෂයන්; ආකඞ්ඛිය, තමාවෙතට ඇද; ආලිඞ්ගිත්වා, බදාගෙණ; නිච්චං, නිතර; තුණ්ඩං, අක්තුඩ; යථා දෙති, යම්සේ දේද; තථා, එසේ; වධූ, ස්ත්‍රීහු; දිඬිදිභේ, දුටුදුටුවන්වැළදගෙණ අන්‍යයන්ටත් මුවතුඩ දෙතිසි සේයි.

72. ථෙය්‍යෙන, චෞර්‍ය්‍යයෙන්; සුරං පිබතං, රාබොන්නන්ගේ; තම්මදෙ, ඒ සුරාමත; පාතුභෙස්සති, එළිවන්නේය; නාරීකතං, ස්ත්‍රීන් කළ; චොරකම්මං, සොරකමත්; සසඞ්කා විය, ශශලපයසේ; දිස්සතෙ, ලෝකයාට පෙණේ.

73. වසං පීන'මගච්ඡන්තා ජනා විජ්ජන්ති කෙ භුවි ?,
මහිස්සරෙ'න්තනො ජයං රක්ඛතෙ සිරසා වහං.

74. තමො'පයාති දීපෙනෙ'වනෙන්තාගෙහෙ ගිහි'ත්ථි'පි,
මන්තිසෙනා'ත්ථි'පි දීපා දිප්පන්ති රාජතෙජසා.

75. රාජිනො'නන්තසිරිනො විසය'මප්‍යෙ'න්ති චඤ්චලා,
කෙලාසෙ'පිස්සරාධීනෙ නා'කංසු සිරිචඤ්චලං.

76. පුණ්ණින්දුදුහිතො'ලූ'පි විස්සජ්ජන්ති'මතප්පභා,
පවත්තෙන්තා'පි පඤ්ඤත්තිං මන්තී රඤ්ඤො පවත්තිතං.

77. පස්සෙසු'භොසු චෙ නත්ථි පදීපා භන්ති නො සුරා,
බ්‍යත්තා මන්තී තත්ථ නත්ථි නරින්දූ'පි න දිප්පරෙ.

---

73. පීනං වසං, සත්‍රීන් වශයට; අගච්ඡන්තා, නොයන්නාවූ; කෙ ජනා, කවරනම් සත්ත්වකෙණෙක්; භුවි, ලොකයෙහි; විජ්ජන්ති, ඇත්තාහුද ? නැත්මැයි; මහිස්සරෙ, මෙහෙසුරුතෙම; අන්තනොජයං, ස්වකීයභාර්‍ය්‍යාව; සිරසාවහං; හිසින් උසුලමින්; රක්ඛති, රකියි.

74. අනෙන්තා ගෙහෙ, ගේතුළ; ගිහි අත්ථි අපි, ගිහිඇතත්; දීපෙන එව, පහණින්ම; තමො, අඳුර; අපයාති, දුරුවේ; මන්තිසෙනා, මන්ත්‍රිබලය; අත්ථි අපි, ඇතත්; දීපා, මීපයෝ; (දිවසින්) රාජතෙජසා, රජතෙදින්; දිප්පන්ති, බබලත්.

75. අනන්ත සිරිනො, අනන්තෛශ්වර්‍ය්‍යඇති; රාජිනො, රජ්ජුගේ; විසයංඅපි, රටටත්; චඤ්චලා එන්ති, චඤ්චල පැමිණෙත්; ඉස්සරාධීනෙ, ඊශ්වරයා අයත්; කෙලාසෙ'පි, කෛලාසයෙහිත්; සිරිචඤ්චලං, ඓශ්වර්‍ය්‍ය කම්පාව; නාකංසු, නොකළාහුද? (කළාහුමැයි.)

76. පුණ්ණින්දු දුහිතා, පුන්සඳට දෙවෙනිවූ; උලුපි, තාරකාවෝද; අමතප්පභා, අමෘතරශ්මීන්; විස්සජ්ජන්ති, පතුරුවත්; රඤ්ඤො, රජ්ජුවිසින්; පවත්තිතං, පවත්වනලද; පඤ්ඤත්තිං, පණත; මන්තීඅපි, මන්ත්‍රිහුද; පවත්තෙන්ති, පවත්වත්.

77. උභොසු පස්සෙසු, දෙපස්හි; පදීපා, ප්‍රදීපයෝ; නත්ථි චෙ, නැත්තාහුනම්; සුරා, දෙවියෝ; නො භන්ති, නොහොබිත්; බ්‍යත්තාමන්තී, ව්‍යක්තාමැතිවරු; තත්ථ, ඒ තමන්දෙපස; නත්ථි, නැත්නාහුනම්; නරින්දූ'පි නිරිඳෝත්; න දිප්පරෙ, නො බබලත්.

78. අකිඤ්චිදුක්ඛා'භයතොබ්‍යන්තා! සිරිසිවජ්ඣොකා,
පඤ්චවෙර විනා පුඤ්ඤං චිණාථ'විජ්ඣමානසා.

79. ඤාණී දිනානි ඛෙපෙන්තා සාධුකං සබ්බපාණිනං,
මච්චා'මරසිරිං පෙච්ච ලභන්ති සිවම'ච්චයෙ.

80. භීත්‍යා නිජන්තිකා'යාත ජනානං රක්ඛකා ජනා,
සදා'භීතා'ච වින්දන්ති සිරි'මාමොක්ඛදස්සනා.

81. නරකාසා'ධික'මඝං නා'පි දිබ්බක්ඛිතෝ'ක්ඛිතං,
තතෝ'ධික'න්තරායෝ'ච පිතරූනම'පොසනං.

82. පුත්තදාරෙ දාසිදාසං ඛෙත්තවත්ථුහරිවසු,
හිත්වාතෙ'මෙ'නුගා හොන්ති පුඤ්ඤපාපා කත'ත්තනා.

---

78 අකිඤ්චිදුක්ඛා, කිසිදුකක් නැතිවූ; උභයතෝ, දෙලොවින්; සිරිසිවජ්ඣොකා, සම්පත හා මොක්ෂය පතන්නාවූ; බ්‍යන්තා, වියතුනි; පඤ්චවෙර විනා, පස්පවින් තොරව; අවිජ්ඣමානසා, දෙවිධියක්නැති සිතින්; (එකාකාරසිතින් යුක්තව); පුඤ්ඤං චිණාථ, පින් රැස්කරව්.

79. සබ්බපාණිනං, සියලු සතුන්ට; සාධුකං, මනාසේ; දිනානි ඛෙපෙන්තා, දවස් යවන්නාවූ; ඤාණීමච්චා, ඥානවන්ත මනුෂ්‍යයෝ; පෙච්ච, පරලොව; අමරසිරිං, දිව්‍යශ්‍රීයද; අච්චයෙ, ඒ ඇවෑමෙහි; සිවං, නිර්වාණයද; ලභන්ති, ලබත්.

80. භීත්‍යා, බියෙන්; නිජන්තික, තමවෙතට, ආයාත, පැමිණියාවූ; ජනානං, සත්‍වයන්; රක්ඛකා, රකින්නාවූ; ජනා, ජනයෝ; ආමොක්ඛදස්සනා, නිවන්දක්නාතෙක්; සිරිං, ලෞකිකසැපත; අභීතාඑව, බියරහිතවම; සදා, හැමකල්හි; වින්දන්ති, විඳිත්.

81. නරකාඝා, නිරදුකටවඩා; අධිකං අඝං, වැඩිදුකක්; දිබ්බක්ඛිනා, දිවැසින්; ඉක්ඛිතමපි, බලනලදුයේත්; න, නැත්තේය; පිතරූනං, දෙගුරුන්; අපොසනං, පොෂණය නොකිරීම; තතොධිකො, ඊටත් වැඩිවූ; අන්තරායො එව, අන්තරායෙක්මැයි.

82. පුත්තදාරෙ, අඹුදරුවන්ද; දාසිදාසං, දාසිදස්ද; ඛෙත්තවත්ථු, කෙත්වත්ද; හරිවසු, රන්රුවන්ද ධන; ඉමෙ, මේ සියල්ලන්; හිත්වාන, හැර; අත්තනා, තමාවිසින්; කතා, කරණලද්දාවූ; පුඤ්ඤපාපා, පින්පව්; අනුගා හොන්ති, (තමන්) කැටුවයන්නෝ වෙත්.

83. අම්බුජම්බුජම්බුජානං නානා ගන්ධා යථා භවෙ,
ගුණා නානා'ව වත්තන්ති ජනානමෙප්‍ය'කකුච්ජියං.

84. ජීවිතං පුත්තදාරා ච සබ්බසසිරි ච වික්කඃමා,
සියුං සුපිනලද්ධ'ංවා'ලොකිතා ඤාණචක්ඛුනා.

85. දුක්ඛද්දිතජනා නාමං වඤ්චා මුච්චන්ති තෙජිනං,
සන්තෙසු සප්පදඨෙසු සුපණ්ණා'ණා විසං විය.

86. ඛණ්ඩදන්තා'කුඤ්චිතවත්තනෙත්තා ච වලිතත්තචා,
නෙතෙ ජහන්ති තාරුඤ්ඤං නරා දණ්ඩපරායණා.

87. ගුණඤාණසිරී රූප යොබ්බඤ්ඤෙහිප්‍යහිතකා,
සිප්පසත්ථමජානන්තා හොන්ති'වාගන්ධකිංසුකා.

---

83. අම්බුජ, දියෙහි හටගත්තාවූ; අම්බුජ, මත්ස්‍යයන්ගේ හා; අම්බුජානං, පද්මොත්පලාදීන්ගේද; ගන්ධා, ගන්ධයතෙම; යථා, යම්සේ; නානා භවෙ, වෙනස්වේද; (එසේම) එකකුච්ජියං, එකකුසෙහි; ජනානං අපි, උපන්නවුන්ගේද; ගුණා, දයාදාක්ෂිණ්‍යාදිගුණයෝ; නානාඑව, වෙනස් වම; වත්තන්ති, පවතිත්.

84. ජීවිතං, ප්‍රාණයද; පුත්තදාරා ච, සුතඹුවෝ ද; සබ්බසසිරි ච, සර්වෛශ්වර්‍ය්‍යශ්‍රීද; වික්කමො, ශෞර්‍ය්‍යප්‍රතිශයද; (යනමොහු) ඤාණ චක්ඛුනා, නුවණැසින්; ඔලොකිතා, බලනලද්දාහු; සුපින, සවප්නයෙන් හෝ සිහිනෙන්; ලද්ධා ඉව, ලද්දවුන්මෙන්; සියුං, වෙත්.

85. දුක්ඛද්දිතජනා, දුඃඛිතජනයෝ; තෙජිනං, තෙදැතියන්ගේ; නාමං වඤ්චා, නම්කියා; මුච්චන්ති, ඒ දුකින්මිදෙත්; සන්තෙසු, ජනයන්; සප්පදඨෙසු, සපුන්ඩැහැකල්හි; සුපණ්ණආණා, ගුරුළු අණින් බානලද; විසං විය, විෂයක් මෙනි.

86. ඛණ්ඩදන්තා, කැඩුණුදත්ඇටඇති; ආකුඤ්චිත, ඇකුළුනාවූ; වත්ත නෙත්තා, වක්‍රනා නෙත්‍රඇති; වලිතත්තචා, රැලිවැටුනුසමඇති; දණ්ඩ පරායනා, සැරයටි දඬු පිහිටකොටඇති; එතෙ නරා, මේ මනුෂ්‍යයෝ; තාරුඤ්ඤං, (සිතෙහි) තරුණබව; නො ජහන්ති, නොහරිත්.

87. ගුණ, ශීලාදිගුණයෙන්ද; ඤාණ, නුවණින්ද; සිරි, සම්පත්ති යෙන්ද; රූප, රූපින්ද; යොබ්බඤ්ඤෙහි, යෞවනයෙන්ද; අභිතකා අපි, හිතානුවූවෝත්; සිප්පසත්ථං, ශිල්පශාස්ත්‍ර; අජානන්තා, නොදන් නාහු; අගන්ධකිංසුකා ඉව හොන්ති, සුවඳනැති කැලමල්මෙන් වෙත්.

88. කත්වා'ත්ත'මෙකකං වෙරී දුවෙ හුත්වා වසන්ති චෙ,
වසීකතෙ'කම්හි තෙසං සබ්බං සිජ්ඣති චින්තිතං.

89. ජයං ථලට්ඨා සුසුකා නො ලභන්ති විනොදකා,
එවං ඨානන්තරං පත්තා වඤ්ඤුරතී වඩ්ඪන්ති න.

90. දදෙ පරෙසමොවාදං ධම්මෙ'ත්තානං නිවෙසිය,
දුට්ඨාචාරජනො'වාදෙ ව්‍යාධධම්මකථා යථා.

91. තුණ්හීභූතො භවෙය්‍ය'ත්තනො නො'චිතසභන්තරෙ,
කුන්ඳෙ බුජ්ඣන්ති දිස්වෙ'න්දුං යථා පඞ්කජකොචනං.

92. න ගච්ඡථ සභාමජ්ඣං යදි පත්තා න භාසථ,
හොථ මොනී කථෙන්තෙ'ඤ්ඤං වත්වා මා යාථ දුග්ගතිං.

---

88. අත්තං, තමන්; එකකං කත්වා, තනිකොට; වෙරී, වෛරීහු, දුවෙ හුත්වා, දෙදෙනෙක්ව; වසන්ති චෙ, වෙසෙත්නම්; තෙසං, ඔවුන් දෙදෙනා අතුරෙන්; එකම්හි, එකෙකු; වසීකතෙ, තමන්වශයට ගත්කල්හි; චින්තිතං, සිතනලද්දවූ; සබ්බං, සියල්ල; සිජ්ඣති, සිදුවේ

89. ථලට්ඨා, ගොඩකට පැමිණියාවූ; සුසුකා, කිඹුල්ලු; උදකා විනා, දියෙන් තොරව; ජයං, දිනීමක්; නො ලභන්ති, නොලබත්; එවං, එසේම; ඨානන්තරං පත්තා, තනතුරුලත් ජනයෝ; වඤ්ඤූ, වෙනෙතිවූ; අරතී, සතුරන්; න වඩ්ඪන්ති, නොනසත්. (ඊටඅපොහොසත්හයිසේයි.)

90. අත්තානං, තමන්; ධම්මෙ, ප්‍රතිරූපධර්මයෙහි; නිවෙසිය, පිහිටුවා. පරෙසං, මෙරමාහට; ඔවාදං දදෙ, අවවාදදෙන්නේය; දුට්ඨා'චාර, නපුරුආචාරඇති; නොහොත් දුශ්චරිතාචාරඇති; ජන, සභ්‍යන්ගේ; ඔවාදෙ, අවවාදයෙහිම; ව්‍යාධ, වැද්දන්ගේ; ධම්මකථා යථා, ධර්මකථා හෝ බණකීම යම්සේද එමෙනි.

91. අත්තනො, තමහට; නොචිත, නුසුදුසුවූ; සභන්තරෙ, සභාමධ්‍යයෙහි; තුණ්හීභූතො භවෙය්‍ය, නිශ්ශබ්දවන්නේය; ඉන්දුං දිස්වා, චන්ද්‍රයා දැක; කුන්ඳෙ, කොඳ; බුජ්ඣන්ති, පුබුදුවනකල්හි; පඞ්කජකොචනං යථා, පද්මයන් හැකිලෙන්නාක් මෙනි.

92. සභාමජ්ඣං, සබමැදට; න ගච්ඡථ, නොයව්; යදි, ඉදින්; පත්තා, පැමිණියාහුද; න භාසථ, නොබණව්; කථෙන්තෙ, යමක් කියනකල්හි; මොනීහොථ, කථානොකරව්; අඤ්ඤං වත්වා, අනෙකක් කියා; දුග්ගතිං, දුගතියට; මා යාථ, නොපැමිණෙව්.

93. යං කිඤ්චි සන්තා'බ්‍යත්තානං විධාය තප්පමාණිකා,
රිත්තෙ තජ්ජා මත්තිකෙවො'රුයා භාජනකාරකා.

94. සහායභාවතො සබ්භි සෙය්‍යො චොරසහායතා,
ධනං'ව චොරා චොරෙන්ති සන්තා සන්තුට්ඨමානසං.

95. ඵද්ධලුද්දගුණීනන්තු තග්ගුණීයෙව නිස්සයා,
හුත්වා'න්දුවෙරෙ'න්ධකාරෙ චොරානං නිස්සයො විය.

96. චින්තාමණීභද්දකුම්භදෙවාගා දෙන්ති සුස්සිරී,
වත්ථුත්තයප්පණාමෙන සුස්සිරී ච සිවං සියා.

97. හරීභහරිමණීසථීඤාතසත්ථවිඤ්ඤුනො,
ගතා විදෙසං තෙ හොන්ති මානිතා'මන්දපීතියා.

---

93. අබ්‍යත්තානං, නොව්‍යක්තයන්ට; (අවියතුන්ට;) යං කිඤ්චි, යම් කිසි වක්; විධාය, විධානකොට; තප්පමාණිකා, එයසැහේයයි පමණකොට ඇති; සන්තා, ජනයෝ; තජ්ජා, ඒ පිණිසවූ; නොහොත් වලන් ඉදිකරන් නාවූ; මත්තිකාරිත්තෙ, මැටිතබා; උරුයා, වැල්ලෙන්; භාජනකාරකා ඉව, බඳුන් සාදන්නන් මෙනි.

94. සබ්භි, සාධූන්හා; සහායභාවතො, මිත්‍රවීමටවඩා; චොරසහායතා, සොරුන් හා මිතුරුබව; සෙය්‍යො, උතුම්; කුමක් හෙයින්දයත්? චොරා, සොරු; ධනංඒව, වස්තුවම; චොරෙන්ති, සොරකම්කෙරෙත්; සන්තා, සජ්ජනයෝ; සන්තුට්ඨමානසං, සතුටුසිත; (චොරෙන්තීති, සොරකම්කෙරෙත්යි යොදනු )

95. ඵද්ධ, තදවූ; ලුද්ද, රෞද්‍රවූ; ගුණීනන්තු, ගුණඇත්තන්හට; තග්ගුණීයෙව, එබඳු ගුණඇත්තෝම; නිස්සයා, පිහිට වෙති; ඉන්දු, චන්ද්‍රයාට; වෙරෙ හුත්වා, වෛරීව; අන්ධකාරෙ, අන්ධකාරයෙනම්; චොරානං, සොරුන්ට; නිස්සයො විය, පිහිට වන්නාක්මෙනි.

96. චින්තාමණි, සිතුමිණද; භද්දකුම්භ, භද්‍රඝටයද; දෙවාගා, කල්පවෘක්ෂයෝද යනමොහු; සුස්සිරී, සුන්දරශ්‍රීන්; දෙන්ති, ලොකයාහට දෙත්; වත්ථුත්තය, රත්නත්‍රය; පණාමෙන, වැඳීමෙන්; සුස්සිරී ච, සුන්දරශ්‍රියත්; සිවං ච, නිර්වාණයත්; සියා, වන්නේය.

97. හරී, සිංහය; ඉභ, හස්තිය; හරී, සවර්ණය; මණී, මැණික්‍ය; ඊස, අධිපතිය; ථී, ස්ත්‍රීය; ඤාත, ප්‍රකටයෝය; සත්ථවිඤ්ඤුනො, ශාස්ත්‍රාර්ථඥය යන; තෙ, ඒ සිංහාදීහු; විදෙසං ගතා, නොරට ගියාහු; අමන්ද පීතියා, නොමද ප්‍රීතියෙන්; මානිතා හොන්ති, පුදනලද්දෝ වෙත්.

98. සිලාලෙණාප්‍ය'චෙතනා'වොපත්ථම්භෙන්ති තපස්සිනං,
ඛ්‍යාතොභයත්ථෙ ජානන්තා කිං න රක්ඛන්ති තෙ ජනා?.

99. මහාපුඤ්ඤා ජනා හොන්ති සිරියා දෙවතොත්තමා,
නරා කප්පෙන මන්ධාතා රජ්ජං නා කාසි කිං දිවෙ?.

100. පභූවෙරමිණාදනං කිණනං ගාමභූමිනං,
පරෙසං දෙසකථනං වෙසං කාරකජන්තූනං,
නිහීයතෙ නිජකුලං කාලපක්ඛෙව චන්දිමා.

101. තෙජීවිරුද්ධා නො යන්ති දූරං හිත්වා ගුණීජනෙ,
නභොමණිබ්භින්නතමො වසන්තොව සහෙන්දුනා.

102. දීපො යාව දසාතෙලෙ දිප්පතෙ'ව තමොනුදං,
යාව පුඤ්ඤං ජනා සබ්බ-සිරිඛ්‍යාතා පදිප්පරෙ.

---

98. අවිඥාඑව, සිත්නැත්තාවූම; සිලාලෙණාඅපි, ගල්ගුහාවෝත්; තපස්සිනං, තපස්වීන්ට; උපත්ථම්භෙන්ති, උදව්කරත්; ඛ්‍යාතා, විශ්‍රුතනී; උභයත්ථෙ, ඓහලෞකිකපාර ලෞකිකාර්ථයන්; නොහොත්-ලෞකිකලොකොත්තරාර්ථයන්; ජානන්තා, දන්නාවූ; ජනා, ජනයෝ; තෙ, ඒ තපස්වීන්; කිං නරක්ඛන්ති, නොරකිත්ද ? රකිත් මැයි.

99. මහාපුඤ්ඤා, මහපිනැති; ජනා, ජනයෝ; සිරියා, ශ්‍රීකරණකොට ගෙණ; දෙවතොත්තමා හොන්ති, දෙවියන්ටත්වඩා උතුම් වෙත්; මන්ධාතා, මන්ධාතෘරජතෙම; නරාකප්පෙන, මනුෂ්‍යාවෙසයෙන්; දිවෙ, දිව්‍ය ලොකයෙහි; රජ්ජං, රාජ්‍යය; කිංනාකාසි, නොකෙළේද ? කෙළේමැයි.

100. පභූවෙරං ච, ප්‍රභූත් හා වෛරයද; ඉණාදනං ච, ණයගැත් මද; ගාමභූමිනං, ගම්බිම්; කිණනං ච, විකිණීමද; පරෙසං, මෙරමාගේ; දෙසකථනං ච, දෙස්කීමද යන; එසං, මෙතීද; කාරකජන්තූනං, කරන්නාවූ ජනයන්ගේ; නිජකුලං, ස්වකීය කුටුම්බය; කාලපක්ඛෙ, කෘෂ්ණපක්ෂයෙහි; චන්දිමා ඉව, සඳමෙන්; නිහීයතෙ, පිරිහේ.

101. තෙජී, තෙදතියන්ට; විරුද්ධා, පටහැනිවූවෝ; ගුණීජනෙ, ගුණවත්ජනයන්; හිත්වා, හැර; දූරං, ඈතට; නො යන්ති, නොයත්; කෙසේදයත්? නභොමණි, සූර්යයාපිසින්; භින්නතමො, බින්අඳුර; ඉන්දුනා සහ, චන්ද්‍රයාසමග; වසන්තො ඉව, වසන්නාක්මෙනි.

102. දීපො, ප්‍රදීපයතෙම; යාව දසාතෙලෙ, සඬවැටි හා තෙල්ඇති තෙක්ම; තමොනුදං, අඳුරනසමින්; දිප්පති එව, බැබලේමැයි; ජනා,

103. නිද්ධනස්සතො'පි භුවි බන්ධාපෙන්ති ජනු'ත්තමා,
රාමො'සුරකතෙ වජ්ජෙ බන්ධාපෙස්‍ය'ණ්ණම'ණ්ණවෙ.

104. සබ්බස්සිරිසිතඩ්ඪානං භුවි ඤාණෙ'ක්ඛිතම්පි නො,
දෙවාගිකුත්තරකුරු-දීපෙ යක්ඛභයං භවෙ.

105. පත්තාබ්‍යත්තාදත්තසබ්බ-සිප්පබ්‍යත්තබුද්ධන්තිකං,
ඛරංසු සූරාභිමුඛෙ දීපා දිප්පන්ති නො විය.

106. කතපුඤ්ඤ'පුඤ්ඤජනෙ පස්සථේ'වෙකතො ඨිතෙ,
සූපවිඨෙ වාහනෙසු කෙචු'බ්බහන්ති ජන්තුනො.

107. සන්තා'ව සාධුවචනං සුණන්ති නෙව දුජ්ජනා,
නාගා'ව ජප්පිතං මන්තං සුණන්ති නෙව ධම්මනී.

---

සාධනයෝ; යාව පුඤ්ඤං, පිනැතිතෙක්; සබ්බසිරි, සම්පූර්ණෛශ්වර්‍ය්‍යයෙන්; ඛ්‍යාතා, ප්‍රසිද්ධව; පදීප්පෙර, බබලත්.

103. භුවි, ලොකයෙහි; උත්තමා ජනා, 'ජනොත්තමයෝ; නිද්ධනස්සතො'පි, නිදෙස් ජනයන්ද; බන්ධාපෙන්ති, සිරකරවත්; අසුරකතෙ, දානවයන් කළ; වජ්ජෙ, වරදනිලා; රාමො, රාමකුමාරතෙම; අණ්ණවෙ, සාගරයෙහි; අණ්ණං, ජලය; බන්ධාපෙසි, සිරකරවීය.

104. භුවි, ලොකයෙහි; සබ්බසිරිසිතඩ්ඪානං, සියලුසැපත්ඇතිනැනක්; ඤාණෙක්ඛිතං අපි, නුවණින්බලනලද්දේත්; නො, නැත්තේය; දෙවාගිකෙ; කප්තුරුඇති; උත්තරකුරුදීපෙ, උතුරුකුරු දිවයිනෙහි; යක්ඛභයං භවෙ, යක්බිය වේ.

105. ආදත්ත, උගත්; සබ්බසිප්ප, සියලු ශිල්පඇති; බ්‍යත්තබුද්ධන්තිකං, වියත්පඬිවරයන්වෙතට; පත්තා, පැමිණියාවූ; අබ්‍යත්තා, අවියත් ජනයෝ; ඛරංසු සූර, කෲරාංශුමත් සූර්‍ය්‍යයාගේ; අභිමුඛෙ, ඉදිරියෙහි; (නොබබලත්නාවූ); දීපා විය, ප්‍රදීපයන්සේ; නො දිප්පන්ති, නොබබලත්.

106. කත, කරණලද; පුඤ්ඤා'පුඤ්ඤජනෙ, පින්පව්ඇති ජනයන්; එකතො ඨිතෙ, එකතුවසිටියවුන්; පස්සථ එව, (නෙත්යොමා) බලත්තේමය; වාහනෙසු, රථාදියානයන්හි; සූපවිඨේ, මොනවට වාඩිගත්තවුන්; කෙචි ජන්තූනො, ඇතැම් ජනයෝ; උබ්බහන්ති, උද්වහනය කරත් (උසුලත්).

107. සන්තා එව, සජ්ජනයෝම; සාධුවචනං, අඪුවත්බස; සුණන්ති, අසත්; දුජ්ජනා, නපුරුජනයෝ; නෙව, නොඅසත්මැයි; ජප්පිතං,

108. සගාම්භීරුකවිඤ්ඤූහි සත්ථමුග්ගහිතං යථා,
සපත්තා'භිමුඛප්පත්තා'බලහත්ථා'ගතා'යුධං.

109. කම්මං කරෙථ ඤාණෙන වීමංසිත්වා'ව සාධුකං,
හොන්ත්‍යෙක'මාරභිත්වා'නුතප්පමානා'විචක්ඛණා.

110. කිඤ්චා'සක්කුනිකං කම්මං දත්තුපා'දය ජත්තුනා,
වායමන්තා නිජං ජත්තුං සයමාරොහිතුං විය.

111. පුඤ්ඤූපලද්ධං මඤ්ඤන්ති මනඤ්ඤාණො'රුසිරිවජ්ජිකා,
සොපද්දවාපගාය'ව පතිතා'තරණඤ්ඤුනො.

112. රුක්ඛමුච්චං නාරුහථො'ත්තරං දෙථ යථාබලං,
නාදෙථ බාලවචනං ඤාණිවාණිං පටිච්ඡථ.

---

මතුරණලද්දවූ; මන්තං, මන්ත්‍රය; නාගා එව, නාගයෝම; සුණන්ති, අසත්; ධම්මනී, ගරඬියෝ; නෙව, නොඅසන්මැයි.

108. සගාම්භීරුක, සහාවටබානසුලුවූ; විඤ්ඤූහි, විඥයන්විසින්; උග්ගහිතං සත්ථං, උගත්ශාස්ත්‍රය; සපත්තා, සතුරන්ගේ; අභිමුඛප්පත්තා, ඉදිරියට පැමිණියාවූ; අබල, දුර්වලයකුගේ; හත්ථාගත, අතටපත්; ආයුධං යථා, ආයුධයක් මෙනි.

109. කම්මං, කරණකර්ම්‍ය; ඤාණෙන, නුවණින්; සාධුකං, මොනවට; වීමංසිත්වාව, විමසාම; කරෙථ, කරව්; එකං, එක්කර්ම්‍යක්; ආරභිත්වා, කරන්ට පටන්ගෙණ; අනුතප්පමානා, පසුතැවෙන්නාහු; අවිචක්ඛණා හොන්ති, විචක්ෂණයෝ නොවෙත්.

110. දත්තු, බාලජනතෙම; අසක්කුනිකං, කරන්ට නොහැකිවූ; කිඤ්චිකම්මං, කිසියම් කර්මයක්; ජත්තුනා උපාදාය, කරපිටට දැඹිව ගෙණ; වායමන්තා, වෙහෙසෙන්නේ; සයං, තෙමේ; නිජං ජත්තුං, ස්වකීය ජත්‍රැවට; ආරොහිතුං විය, නගින්ට වෙහෙසෙන්නෙක් මෙනි.

111. පුඤ්ඤූපලද්ධං, කර්මානුරූපපරිද්ජෙදන් ලද්දෙය; මඤ්ඤං ඉති, මදයයි; මනඤ්ඤාන, ඍනා; උරුසිරිවර්ජකා, මහත්සම්පත් පතන්නෝ; සොපද්දව, උවදුරුසහිතවූ; ආපගායං, ගඟෙහි; පතිතා, වැටුනාවූ; අතරණඤ්ඤූනො ඉව, පිනුම් නොදන්නන් මෙනි.

112. උච්චං රුක්ඛං, උස්රුකට; නාරුහෙථ, නොනගිව්; යථා බලං, බලපමණින්; උත්තරං, පිළිතුරු; දෙථ, දෙව්; බාලවචනං, අඥානජනයන්ගේ කීම; නාදෙථ, නොගණිව්; ඤාණි වාණිං, පණ්ඩිතජනවචනය; පටිච්ඡථ, පිළි ගණිව්.

113. එකො රත්තින්දිවාමජ්ඣෙ පරත්ථිචොරපච්ඡන්නො,
නො යාස'නත්ථො හොතෙව ජනෙ'ත්ථ නත්ථි සංසයො.

114. නා'යං සොණ්ණමයා'ණී'ති විනා සාණා පතීයතෙ,
නප්පතීයන්ති මණයො'ච්ඡී'ච්ඡි'පි රවිනා විනා.

115. ධනීනං තුච්ඡවත්ථූනං දදන්තා'පි ජනා ධනං,
ලභන්ත්‍යා'දිච්චපූජාය පදීපො'ජ්ජාලනං විය.

116. තපස්සීනං ගරූනං ච විපස්සීනං සුධාසිනං,
භත්‍යාදරමකත්වානා'නත්ථො හොතෙව නින්දතං,

117. කූටසක්ඛිඤ්ච පෙසුඤ්ඤඤ්ච මුද්ධච්චවචනං මුසා,
නිට්ඨුරතීඵරුසොත්තිං මියන්තා'පි නභාසරෙ.

---

113. එකො, තනිව; රත්තින්දිවාමජ්ඣෙ, රාත්‍රිදිනමධ්‍යයෙහි; පරත්ථී, පරස්ත්‍රීන්ගේ හා; චොර, චෞරයන්ගේ; පච්ඡන්නො, පස්සෙන්; නො යාසි, නොයව; අනත්ථො හොති එව, අවැඩ වේමැයි; එත්ථ, මෙහි; සංශයො නත්ථි, සැකනැති; ජන, ඒ දනුව.

114. අයං ආණි, මේ ඇණය; සොණ්ණමයා ඉති, රන්මුවායයි; සාණං විනා, හණගලින් හෝ උරගලින් තොරව; නප්පතීයතෙ, නොහැඟේ; අච්ඡි අච්ඡී අපි, ඇස් ඇතත්; රවිනා විනා, සූර්‍ය්‍යාලොකයෙන් තොරව; මණයො, මැණික්; නප්පතීයන්ති, නොහැඟෙත්. (නොපෙණෙත්)

115. ධනීනං, ධනවතුන්ට; තුච්ඡවත්ථූනං, ස්වල්පවස්තූන්; දදන්තා අපි, දීමෙනුත්; ජනා; ජනයෝ; ධනං ලභන්ති, වස්තුව ලබත්; ආදිච්ච පූජාය, සූර්‍ය්‍යාපිදීමපිණිස; පදීපොජ්ජාලනංවිය, පහන්දල්වීම මෙනි.

116. තපස්සීනං, තාපසවරුන්ටද; ගරූනං ච, ගුරුවරුන්ටහා දෙමව්පියන්ටද; විපස්සීනං, පණ්ඩිතයන්ටද; සුධාසීනං, දෙවියන්ටද; භත්‍යාදරං, භක්ත්‍යාදරය; අකත්වාන, නොකොට; නින්දතං, නින්දා කරන්නන්ට; අනත්ථො හොති එව, අවැඩ වේ මැයි.

117. කූටසක්ඛිඤ්ච, කූටදෙස්ද; පෙසුඤ්ඤඤ්ච, කේලාම්ද; උද්ධච්ච වචනං, උඩඟුබස්ද; මුසා, බොරුද; නිට්ඨු, නිට්ඨුබස්ද; රති, රතිකථාද; ඵරුසොත්තිං, රළුබස්ද; මියන්තා අපි, මියෙත්මුත්; න භාසරෙ, නොකියව්.

118. කත්වා'පුඤ්ඤාන්‍යමඤ්ඤනි පුඤ්ඤස්ස කරණං පුන,
සුගන්ධා'ලෙපනං කායෙ ඨත්වෙ'වාසුචිකාසුයං.

119. සිරී නිධෙය්‍යුං,චෙ'භුත්වා'පාත්වා'ථොපෙන්තිධම්මිනං,
රසනා භොජනරසං භුඤ්ජන්තී'ව රදෙ රිතෙ.

120. හොන්තිස්සිරිවයා'යො'ත්තමානම්පිගුණඤ්ඤුණිනං,
ජනත්තා'නන්දජනක-පීණින්දුභාතිවුඩ්ඪි'ව.

121. ධම්මං ධනං ච විජ්ජා චා'භයං වත්ථං ච භොජනං.
තාම්බූලී චෙති'මෙ දෙන්ති පෙමෙනා'මන්දපීතියා,
තං වතුත්තමදාන'න්ති දීපෙන්ති භුවි පණ්ඩිතා.

122. රාජනො නටකා චොරා සරා කෙළීච දූතියො,
සුරාසොණ්ඩා'තිමෙසානං හවෙ භායන්ති සෙවිනො.

---

118. අමඤ්ඤනි අපුඤ්ඤානි කත්වාන, බොහෝපව් කොට; පුන, නැවත; පුඤ්ඤස්ස කරණං, පින්කිරීම; අසුචිකාසුයං, අමෙධ්‍යා'වාටයෙක්හි, ඨත්වා, බැසසිට; කායෙ, කයෙහි; සුගන්ධාලෙපනං ඉව, සුගන්ධාලෙප කිරීමක් මෙනි.

119. අභුත්වා, නොකා; අපාත්වා, නොබී; සිරී, සම්පත්තිය; නිධෙය්‍යුං වෙ, ඉදින්සඟවාතබත්නම්; අථ, යළි; ධම්මිනං, පුන්‍යවන්තයන්කරා; උපෙන්ති, එළඹෙත්; රදෙ රිතෙ, දන්තයන්හැර; භොජනරසං, බොජුන්රසය; භුඤ්ජන්ති, විඳින්නාවූ; රසනා ඉව, දිවමෙනි.

120. ගුණඤ්ඤුණිනං, ගුණනුවණැති; උත්තමානම්පි, උතුමන්ටත්; සිරිවයායා, සම්පත් හානිය හා වෘද්ධිය; හොන්ති, වෙත්; ජනත්තානන්ද ජනක, ජනමනොනන්දජනකවූ; පීණින්දු, පූර්ණිමන්ද්‍රයාගේ; භාතිවුද්ධිඉව, කෘෂ්ණපක්ෂයෙහි පිරිහීම හා ශුක්ලපක්ෂයෙහි වෘද්ධිවීම මෙනි.

121. ධම්මං ච, ධර්මයත්; ධනං ච, ධනයත්; විජ්ජා ච, විද්‍යාවත්; අභයං ච, නිර්භයත්; වත්ථං ච, වස්ත්‍රත්; භොජනං ච, බොජුනුත්; තාම්බූලීච ඉති, බුලතුත් යන; ඉමෙ, මේදේ; පෙමෙන, ප්‍රේමයෙන්; අමන්දපීතියා, බොහෝවූ ප්‍රීතියෙන්; දෙන්ති, අනුන්ට දෙත්නම්; තං, ඒ දීම; වත, එකාන්තයෙන්; උත්තමදානන්ති, උතුම් දනැයි; භුවි, ලෙව්හි; පණ්ඩිතා, බුද්ධාදී පණ්ඩිවරයෝ; දීපෙන්ති, වදාරත්.

122. රාජනො, රජදරුවෝද; නාටකා, නළුවෝද; චොරා, සොරුද; සරා, විල්ද; කෙළීච, ක්‍රීඩාද; දූතියො, ධූර්තස්ත්‍රීහුද; සුරාසොණ්ඩාඉති, රාසොඬුදූයියන; ඉමෙසානං, මොවුන්; සෙවිනො, සොයන සුල්ලෝ, හවෙ, එකාන්තයෙන්; භායන්ති, පිරිහෙත්.

123. බ්‍යත්තසඞ්ඝම්හි ඥාණ'ක්ඛි,'පර'ක්ඛි සෙසසඞ්ඝම්හි,
අතො නෙත්තානවග්ගා හීනා යෙ තෙ දුප්පථගාමිනො.

124. හුත්වාසහායා'සාධූහි වාසතො සහ සාධුහි,
මිත්තො හුත්වාන වසනං සදෙත්තරිතරං භවෙ.

125. පරිවාරයසොසෙසු සන්තෙසුපිහි භූරිසු,
භවිතබ්බං භවත්‍යෙවෙන්දුනොව රාහුපීළනං.

126. සම්පද'ධම්මලද්ධාහි චොරිකාතෙනා'ව නස්සති,
සා ධම්මලද්ධාදෙවින්ද-ලද්ධාවිය නනස්සති.

127. පූරිතො'දකවාපීපාලීමාතිකායෙව පාලිතා,
දත්වා'භයත්ථෙ සාධෙථ දනං ඥාණී මහාධනී.

---

123. බ්‍යත්තසඞ්ඝම්හි, පණ්ඩිතජනසංඝයා; ඥාණක්ඛි, ප්‍රඥාචක්ෂු යෙහි; සෙසසඞ්ඝම්හි; අවශෙෂ ජනසංඝයා; අපරක්ඛි, අන්‍යාක්ෂි යෙහි; අතොනෙත්තානවග්ගා, මේනෙත්දෙකින්; යෙ, යම්කෙනෙක්; හීනා, පරිහීනවෙත්ද; තෙ, ඒජනයෝ; දුප්පථගාමිනො, නොමග යන සුල්ලෝයී.

124. අසාධුහි, දුජනන්හා; සහායොහුත්වා, මිත්‍රව; වාසතො, විසීමටවඩා; සාධූහිසහ, සත්පුරුෂයන් හා; මිත්තොහුත්වාන, මිත්‍රව; වසනං, විසීම; සදා, සැමකල්හිම; උත්තරිතරං භවෙ, අතිශයින් උතුම් වේ;

125. භූරිසු, අනල්පවූ; පරිවාරයසො සෙසු; පිරිවරහා කීර්තිසමූහයන්; සන්තෙසුපිහි, ඇතිකල්හිද; භවිතබ්බං, වියයුත්ත; භවති එව, ඔවුන්ට වේමැයි; ඉන්දුනො, චන්ද්‍රයාගේ; රාහුපීළනං ඉව, රාහු පීඩනය මෙනි.

126. අධම්මලද්ධා, අධර්මයෙන් ලද්දාවූ; සම්පදාහි, සැපතවනාහි; චොරිකතෙනාඉව, සොරුන්විසින් උපයනලද වස්තුවක්මෙන්; නස්සති, නැසෙ; ධම්මලද්ධා, දැහැමින්ලද්දාවූ; සා, ඒසැපත; දෙවින්දලද්ධාවිය, ශක්‍රයාවිසින් ලද්දක්මෙන්; නනස්සති, නොනැසේ.

127. ඥාණී, නුවණැත්තාවූ; මහාධනා, මහත්ධනවත්තයෙනි! පූරිතොදක; පිරුණුදිය ඇති; වාපීපාලි, වැව්ඉවුර; මාතිකාය, පිටවානෙන්; පාලිතාඉව, පාලනයකරණලද්දක්මෙන්; දනං දත්වා, දන්දී; උභයත්ථෙ, උභයලොකාර්ථයන් නොහොත් ලෞකිකලෝකොත්තරාර්ථයන්; සාධෙථ, සිද්ධකරව්.

128\. නරින්දගරුමිත්තානං ජායා ජායාජනෙත්ති ච,
ඤාණී නිජං ජනෙත්තිං වෙ'මායො තක්කෙන්ති සජ්ජනා.

129\. ලොකෙ ඛ්‍යාතා කිඤ්චනානං දෙය්‍යධම්මං වතුත්තමං,
තම්හිස්සරියමත්තස්ස ඛෙත්තෙ'වබීජවප්පනං.

130\. බද්ධත්ථිරවතිඛෙත්තං පසූනං වා'ප්පවෙසනං,
විසුද්ධං කතපුඤ්ඤානං නත්ථි කිච්ඡං කදාචන.

131\. දන්තී සවන්තී සවිසා 'සන්තා කන්තා ච භූභුජා,
සිඞ්ගී නඛී වෙ'ති' මෙහි කීළනා ව්‍යසනං භවෙ.

132\. ලොභ දොස මොහමද-මත්තස්ස න තපොක්‍රියා,
චත්තාරො'මෙ යස්සත්ථි තදිදං නත්ථි තස්සපි.

---

128\. නරින්ද, නිරිඳුන්ගේද; ගරු, ගුරුවරුන්ගේද; මිත්තානං, මිතුරන්ගේද; ජායා, භාර්‍ය්‍යාවන්හා; ජායාජනෙත්තිච, ස්වකීය භාර්‍ය්‍යාවගේ මැනියෝද යන; ඉමායො, මේහැමදෙන; ඤාණී, නුවණැති; සජ්ජනා, සාධුජනයෝ; නිජං ජනෙත්තිං ඉව, සියමවමෙන්; තක්කෙන්ති, සලකත්.

129\. ඛ්‍යාතා, විඛ්‍යාතනි; ලොකෙ, ලොකයෙහි; අකිඤ්චනානං, නිර්ධනීන්ට; දෙය්‍යධම්මං, දියයුතු වස්තුව; ව, ඒකාන්තයෙන්; උත්තමං, උතුම්වස්තුවකි; ඉස්සරියමත්තස්ස, ඓශ්වර්‍ය්‍යමදයෙන් මත්වූවාහට; තං, ඒ දෙය්‍යධර්මය; ඛෙත්තෙ, කෙතෙහි; බීජවප්පනං ඉව, බිජු වැපිරීමක් මෙනි.

130\. බද්ධ, බඳිනලද; ථිරවති, තහවුරු වැටඇති; ඛෙත්තං, කෙත කට; පසූනං, සිව්පාවුන්ගේ; අප්පවෙසනං ඉව, නොපිවිසීමක්මෙන්; විසුද්ධං, පරිශුද්ධව; කතපුඤ්ඤානං, කළපිනැතියන්ට; කදාචන, කිසි කලෙකත්, කිච්ඡං, දුකක්; නත්ථි, නැත්තේය.

131\. දන්තීච, දත්ඇත්තෝද; සවන්තී ච, නදීහුද; සවිසාච, විස ඇත්තෝද; අසන්තාච, දුර්ජනයෝද; කන්තාච, ස්ත්‍රීයෝද; භූභුජාච, රජදරුවෝද; සිඞ්ගීච, අංඇත්තෝද; නඛීච ඉති, නියඇත්තෝ දූයි යන; ඉමෙහි; මොවුන්හා; කීළනා, ක්‍රීඩා කිරීමෙන්; ව්‍යසනං භවෙ, දුකක් වන්නේය.

132\. ලොභ, ලොභයෙන්ද; දොස, ද්වේෂයෙන්ද; මොහ, මෝහයෙන්ද, මද, යෞවනාදී මදයෙන්ද; මත්තස්ස, මත්වූ ජනයාහට; තපොක්‍රියා, තපඃකර්මයක්; න, නැත; ඉමෙචත්තාරො, මේලොභාදී සතරදෙන; යස්ස, යමෙකුට; අත්ථි, ඇත්තාහුනම්, තස්ස අපි, ඔහටත්; තදිදං, ඒමේ තපඃකර්මය; නත්ථි, නැති.

133. දිජී ජනෙ බහුසුතෙ ගාව්‍යෙ'කං තෙව වඩ්ඪරෙ,
නස්සන්ති ජනතාඝාත-කුලෙව වඩ්ඪරෙ පරෙ.

134. මජ්ජපානං පාපියානං දුනමොවාද වාණිනං,
යථා දහනමුක්කාය නිමුග්ගස්ස ජලන්තරෙ.

135. සුරාසොණ්ඩා'හුයමච්ච ගුණයුත්තක්ඛණෙ ඨිතා,
පීත්වා'ක්ඛෙදන්ති සුරං වින්දමානං දුක්ඛං න පස්සථ.

136. සන්නිධාය ධනං බාලා 'භුත්වා'දත්වා 'යුරක්ඛකා,
ඛෙතෙන බද්ධා මච්චරූපා විය ඛායන්ති පෙක්ඛිතා.

137. යස්සා'දදෙය්‍ය සම්පත්තිං රොදපෙන්තො හඨෙන සො,
රොදපයං තං හරන්ති සතක්ඛත්තුම්පි තස්සිරිං.

---

133. දිජී, දිවිදෙන; බහුසුතෙ, බොහෝ දරුවන්; ජනෙ, වදත්නිය; ගාවී, ගවදෙන; එකං, එකපැටියෙකු; ජනෙ, වදත්නීය; තෙඑව, ඒ ගවයෝම; වඩ්ඪරෙ, වැඩෙත්; ජනතාඝාතකුලා, ජනතාවන් නසන කුලයෝ; නස්සන්ති, නැසෙත්; අපරෙ, අන්‍ය (ධර්මිෂ්ඨ) කුලයෝ; වඩ්ඪරෙ එව, වැඩෙත්මැයි.

134. මජ්ජපානං, මත්පැන් බොත්නාවූ; පාපියානං, පවිටත්ට; ඔවාදවාණීනං දුනං, ඔවාබස්දීම; ජලන්තරෙ නිමුග්ගස්ස, දියතුළගිලුනු එකෙකු; උක්කාය, ගිනිසුලකින්; දහනං යථා, පිළිස්සීමක්මෙනි.

135. සුරාසොණ්ඩා අහුය, සුරාසොඬුනොව; මච්චගුණයුත්තක්ඛණෙ, මනුෂ්‍යගුණයෙන්යුත් ඇසිල්ලෙහි; ඨිතා, සිටියාවූ තොපි; සුරං පීත්වා, රාබී; අක්ඛෙදන්ති, අන්‍යයන්විසින්; වින්දමානං, විඳිනුලබන්නාවූ; දුක්ඛං, තිරිහැරය; නපස්සථ; නොදකිව්ද ?

136. ධනං, වස්තුව; අභුත්වා, නොකා; අදත්වා, ශ්‍රමණබ්‍රාහ්මණා දීත්ට නොදී; සන්නිධාය, රැස්කොට තබා; ආයුරක්ඛකා, දිවිරකින් නාවූ; බාලා, අඥානජනයෝ; පෙක්ඛිතා, නුවණින් බලනලද්දාහු; ඛෙතෙන බද්ධා, කෙතෙහි බදිනලද්දාවූ; මච්චරූපාවිය, මිනිස්සටහන් මෙන්; (පඹයන්මෙන්) ඛායන්ති, වැටහෙත්.

137. සො, යමෙක්; යස්ස, යමෙකුගේ; සම්පත්තිං, සැපත, හඨෙන, බලාත්කාරයෙන්; රොදාපෙන්තො, හඬවමින්; ආදදෙය්‍ය, ගන්නේවී නම්; තම්පි, ඔහුත්; රොදපයං, හඬවමින්; තස්සිරිං, ඔහුසතුසැපත; සතක්ඛත්තුං, සියක්වර; හරන්ති, පැහැරගණිත්,

138. ලොකස්ස ලද්ධිස්සරියා කරොන්ති චා'හිතක්‍රියා,
ලොකින්දෙ සො'පි ගොවින්දෙ මහාභිසයනෙ සයෙ.

139. සුසික්ඛිතා'නප්පනෙක සිප්පා පි චපලා ජනා,
කෙ දිස්සමානබිම්බෙන්දු චාපල්‍යං න ජහන්ති ව.

140. ධනීපි මච්ඡරී දාන මාහු නොදාතුමත්ථිනං,
මොනං'ව ලොකෙ මූගාන මත්ථී'පිනිඛිලශ්සිරී.

141. බහුනග්ඝන්ති මුත්තායො තථා නාග්ඝන්ති සිප්පියො,
කතපුඤ්ඤා පුරෙ පුත්තා දිප්පන්තෙ'ව'ප්පජන්තුනං.

142. න සිජ්ඣතෙ කුසීතස්ස සිප්පං තෙනා'ධනො භවෙ,
නත්ථිමිත්තා නිධනස්ස න සො තෙන සුඛං ලභෙ.

---

138. ලද්ධිස්සරියා, ලද්ඉසුරුඇත්තෝ; ලොකස්ස, ලොවට; අහිතක්‍රියා, අවැඩදෙය; කරොන්ති ච, ඇතැම්විටකෙරෙති; ලොකින්දෙ, ලොකෙන්ද්‍රවූ; සො ගොවින්දෙ අපි, ඒවිෂ්ණුතෙමේද; මහාභිසයනෙ, (අනන්ත) මහානාගසයනයෙහි; සයෙ, නිදන්නේය.

139. චපලා, ස්ථිරබැව්නැති; ජනා; සත්වයෝ; සුශික්ෂිත, මොනවටනික්මුනු; අනප්පා, අනල්පවූ; අනෙකශිල්පාව, නානාශිල්ප ඇත්තාහුද; චාපල්‍යං, තරලතාව; නජහන්ති, නොහරිත්; කෙසේදයත්? කෙ, දියෙහි; දිස්සමාන, පෙණෙන්නාවූ; බිම්බා, බිඹුඇති; ඉන්දු ඉව, සඳමෙනි.

140. මච්ඡරී, මසුරුජනයෝ; ධනීපි, වස්තුඇත්තාහුද; අත්ථිනං, යාචකයන්ට; දානංදාතුං, දන්දෙනුසඳහා; නොආහු, නොකියති; ලොකෙ, ලොව; නිඛිලශිරිඅත්ථීඅපි, සියලුසම්පත්ඇතත්; මූගානං, ගොළුවන්ගේ; මොනං ඉව, නොබිණීමමෙනි.

141. මුත්තා, මුතු; බහුනි, බොහෝමිල; අග්ඝන්ති, අගිත්; සිප්පියො, මුතුබෙල්ලෝ; තථා, එසේ; නාග්ඝන්ති, නොඅගිත්; අප්පජන්තූනං, අල්පජනයන්ගේ; පුත්තා, දරුවෝ; පුරෙ, පෙර; කතපුඤ්ඤා, කළපිනැත්තෝ; දිප්පන්ති එව, ඒ අල්පජනකයන්ට වඩා උසස්ව බබලත්මැයි.

142. කුසීතස්ස, මැලිනැත්තාහට; සිප්පං, ශිල්පය; නසිජ්ඣතෙ, නොසැදේ; තෙන, එහෙයින්; අධනො භවෙ; ධනනැත්තෙක් වේ; නිධනස්ස, ධනනැත්තාහට; මිත්තා, මිතුරෝ; නත්ථි, නැත්තාහ; තෙන, එමිතුරන්නැතිබැවින්; සො, හෙතෙම; සුඛං, සැප; නලභෙ, නොලබන්නේයි.

143. පයොදධිට්ඨො'පි කණ්හා යථා නොපාති, තජ්ජලං,
තථො'භයත්ථ කො ච'ත්ථො නත්ථි මච්ඡරි සෙවිනො.

144. ඛෙත්තා'පනෙත්වා පසූතං, රක්ඛණං විය'පද්දවෙ,
දසධම්මිකරජ්ජුහි පජාකිච්චං විගච්ඡති.

145. බාලංසුමාල්‍යංසුනෙ'ව තමොක්ඛන්ධවිධංසනං
මජ්ඣත්තරජ්ජුපායාතා'මිත්තා ධුතා'පයන්ති වෙ.

146. ලොකං නරින්ද රක්ඛන්තො'කාසං නො දෙන්ති දුක්ඛිතුං,
ලොකාරක්ඛක මෙඝෙන කාලෙ වස්සාපතං විය.

147. සීතානිලවසීභූතො'නලොව දවදූහකො,
රාජතෙජො'පසම්මන්ති මන්තී සන්තිවචො'ම්බුනා.

---

143. කණ්හා, විෂ්ණුනෙම; පයොදධිට්ඨොපි, ක්ෂීරසාගරස්ථවූයේද; තජ්ජලං, ඒදිය; යථා, යම්සේ; නොපාති, නොබොයිද; තථා, එපරිද්දෙන්; මච්ඡරිසෙවිනො, මසුරුජනයන් සේවනයකරන්නාහට; උභයත්ථ, දෙලොවෙහි; කොචිඅත්ථො, කිසිඅර්ථයෙක්; නත්ථි, නැත්තේය.

144. ඛෙත්තා, කෙතකෙරෙන්; අපනෙත්වා, දුරුකොට; පසූතං උපද්දවෙ, සිව්පාඋවදුරු; රක්ඛණංවිය, රකින්නාක්මෙන්; දසධම්මික, දශරාජධර්මයෙහි පිහිටියාවූ; රජ්ජුහි, රජ්ජුන්කෙරෙන්හෝ (කාරණකොට ගෙණ); පජාකිච්චං, ප්‍රජාදුඃඛය; විගච්ඡති, පහවේ.

145. බාලංසුමාලි, ලහිරුගේ; අංසුනා, රශ්මියකාරණකොටගෙණ; තමොක්ඛන්ධ, අන්ධකාරස්කන්ධයාගේ; විධංසනංඉව, විධ්වංසනයමෙන්; මජ්ඣත්ත, මධ්‍යස්ථවූ; රාජ, රජ්ජුන්කරා; උපායානා, එළඹියාවූ; අමිත්තා, සතුරෝ; ධූතා, කම්පිතව; වෙ, ඒකාන්තයෙන්; අපයන්ති, පහවෙත්.

146. ලොකං රක්ඛන්තා, ලෝරකින්නාවූ; නරින්ද, නිරිඳේ; දුක්ඛිතුං, දුක්වන්ට; ඔකාසං, ඉඩක්, නොදෙන්ති, නොදෙත්; ලොක රක්ඛක, ලෝරක්නාවූ; මෙඝෙන, මෙඝයෙන්; කාලෙ, සුදුසුකාලයෙහි; වස්සාපතං විය, වැසි වැස්වීමමෙනි.

147. සීතානිල, සිහිල් පවනින්; වසීභූතො, වසඟකරණලද්දාවූ; දවදූහකො, වනදවන්නාවූ; අනලොඉව, වහ්නියමෙන්; මන්තී, ගුණවත් මන්ත්‍රීන්ගේ; සන්තිවචො, කලණවදන්නැමති; අම්බුනා, ජලයෙන්; රාජතෙජා, රජ්ජුන්ගේ තෙද; උපසම්මන්ති, සංසිඳෙත්.

148. න සක්කා මුඤ්චිතුං සොප්පා පවිට්ඨා'පි ච කත්ථචි,
කතරාජා 'පරාධානං ඨානං නත්ථි නිලීයිතුං.

149. අවිභායාදදෙ දුක්ඛං දුක්ඛිතෙ නිජසාමිනී,
කිත්තිස්සිරි'පි හොන්ත්‍යත්ථ හත්ථගා ච සුරස්සිරී.

150. සන්තෙහි මන්තීහි රඤ්ඤ'මුභයත්ථා සමිජ්ඣරෙ,
මහොසධග්ගඤ්ඤාණෙන සිද්ධත්ථා ධම්මතො සුතා.

151. භූරිසත්තගුණොපෙත කතවෙදීහි රාජුහි,
මිත්තා'මිත්තා හොන්ති වදෙ 'නුක්කමං තප්පවත්තියා.

152. රඤ්ඤො'ව නියතො යොගො වචනෙ විඤ්ඤූමන්තිනං,
භාවෙ සිජ්ඣෙ ජනක්ඛත්තං දයාවුට්ඨ්‍යා සමිජ්ඣති.

---

148. කත්ථචි, කිසිතැනකත්; පවිට්ඨාපිච, පිවිසියාහුද; සොප්පා, සවප්නයෙන්; මුඤ්චිතුං, මිදෙන්ට; නොසක්කා, නොහැකිවෙ (එමෙන්ම) කත, කරණලද; රාජාපරාධානං, රාජාපරාධයන්ට; නිලීයිතුං, සැඟවෙන්ට හෝ පිවිසෙන්ට; ඨානං නත්ථි, සුදුසුතැනක් නැති.

149. නිජසාමිනී, සවකීය ස්වාමියා; දුක්ඛිතෙ, දුකට පත්කල්හි; අවිභාය, බැහැරනොකොට; දුක්ඛං ආදදෙ, ඔහුපිණිස දුක්ගණීනම්; අත්ථ, මෙලොව; කිත්තිස්සිරිපි, කීර්තිශ්‍රීද; හොන්ති වෙත්; ච, (පුන) භවාන්තරයෙහි; සුරස්සිරී, දිව්‍යසම්පත්; හත්ථගාච, අත්පත්ද වේ.

150. සන්තෙහි, ශාන්තවූහෝ පණ්ඩිතවූ; මන්තීහි, මන්ත්‍රීන්කරණකොටගෙණ; රඤ්ඤං, රජුන්ගේ; උභයත්ථා, දෙලෝවැඩ; සමිජ්ඣරෙ, සමෘඬවෙත්; මහොසධ, මහෞෂධපඬිතුමන්ගේ; අග්ගඤ්ඤාණෙන, උත්තමඥණයෙන්; සිද්ධත්ථා, පරිනිෂ්පන්නාර්ථයෝ; ධම්මතො, දෙශනාවෙන්; සුතා, අසනලද්දහුයි.

151. භූරි, බහුලවූ; සත්තගුණොපෙත, සත්වගුණයෙන් යුක්තවූ; කතවෙදීහි, කෘතඥවූ; රාජුහි, රජුන්හා; අමිත්තා, සතුරෝ; මිත්තා හොන්ති, මිතුරුවෙත්; තප්පවත්තියා, ඒපුවතපිළිබඳවූ; අනුක්කමං, පරිපාටිය; වදෙ, කියමි.

152. විඤ්ඤූමන්තිනං, නුවණැතිමැතිවරුන්ගේ; වචනෙ, කීමෙහි; යොගො, යෙදීම; රඤ්ඤො, රජහට; නියතොඑව, නියමමැයි; භාවෙ, අදහස; සිජ්ඣෙ, සිදුකල්හි; දයාවුට්ඨ්‍යා, කුළුණුනැමැතිවැස්සෙන්; ජනක්ඛත්තං, ප්‍රජාක්ෂෙත්‍රය; සමිජ්ඣති, සමෘඬ වේ.

153. රඤ්ඤෙ කුප්පන්ති නස්සන්ති කතපාපා ජනා භුවි,
මෙසවඩ්ඪීන භොජනස්සෙ'වා'ති වෙසෙන නස්සනං.

154. දුක්ඛං පරස්සා'දත්වා'න පත්වා'න සන්තසන්තිකං,
වීතිනාමෙති යො තස්සා'ධික'මිස්සරියං සියා.

155. කුලං පසිද්ධං සුද්ධම්පි දුජ්ජනො යද්‍යුපාගතො,
විසමිස්සා'මතං 'වා'සු තං කුලං පරිහායති.

156. නෙව'ත්ථි වත්ථුරුතරං ජගතී ජගතී නිභං,
සාධිනෙනා'පරාධා'ධිවාසනං වෙ තතො'ධිකං.

157. කුලාචලෙහි සන්දිප්පමානො නෙරුනගො විය,
ලොකෙ නරින්දා දිප්පන්තා 'මච්චෙහි වුජ්ජලන්ති තෙ.

---

153. රඤ්ඤෙ, රජු; කුප්පන්ති, කිපෙනකල්හි; භුවි, ලොකයෙහි; කතපාපා, කළපව්ඇති; ජනා, ජනයෝ; නස්සන්ති, නැසෙත්; මෙසවඩ්ඪීන, මේෂයන් වැඩුනාවූ; භොජනස්ස, කෑම; අතිවෙසෙන, වැඩි වැස්සෙන්; නස්සනං ඉව, නැසීම මෙනි.

154. යො, යමෙක්; පරස්ස, පරහට; දුක්ඛං අදත්වාන, දුක්කරදර නොදී; සන්තසන්තිකං, සත්පුරුෂසංසර්ගයට; පත්වාන, පැමිණ; වීතිනාමෙති, දවස්යවාද; තස්ස, ඔහට; අධිකං ඉස්සරියං, අධිකෛශ්වර්‍ය්‍යය; සියා, වන්නේය.

155. පසිද්ධං, ප්‍රකටවූ; සුද්ධම්පි, පරපවාද නැත්නාවූද; කුලං, කුටුම්බයකට; යදි, ඉදින්; දුජ්ජනො, දුර්ජනයෙක්; උපාගතො, එළඹියේනම්; තං කුලං, ඒකුලය; ආසු, වහාම; පරිහායති, පිරිහේ; කුමක්මෙන්දයත් ? විසමිස්ස අමතං ඉව, විසමුසුඅමාවක් මෙනි.

156. ජගති, ලොකයෙහි; ජගතිනිභං, පෘථිවියසම්වූ; උරුතරං වත්ථු, ඉතාමහත් වස්තුවක්; නෙවත්ථි, නැත්මැයි; සාධිනෙන, ස්වාධීනයෙකුවිසින්; අපරාධා'ධිවාසනං, අනුන්වරද ඉවසීම; වෙ, ඒකාන්තයෙන්; තතො, ඒපොළවටත්වඩා; අධිකං, වැඩිමහති.

157. කුලාචලෙහි, සත්කුලපව්වලින්; සන්දිප්පමානො, මොනවට බබලන්නාවූ; නෙරුනගොවිය, මහාමෙරුපර්වතයමෙන්; ලොකෙ, ලෙව්හි; දිප්පන්තා, බබලන්නාවූ; තෙ නරින්දා, ඒනිරිඳු; අමච්චෙහි, ඇමතියන්කරණකොටගෙණ; උජ්ජලන්ති, උසස්ව බබලන්නාහුයි.

158. දිවාරත්තිං දිප්පමානා සුරා රවින්දු සන්නිභා,
දිස්සන්තා නත්ථීදිසානං භයං හොතේ'ව රාහුතො.

159. අපාපබද්ධ චිත්තස්සා'දීනවො'ප්‍යුප ජායතෙ,
වත්තෙ'සත්තං කරෙ සත්තං විසං'වා'ඝං කරොති න.

160. සීතානිලාතමනල වෙමජ්ඣෙ වා විනස්සනං,
සත්තරාජන්තිකං පත්ත මන්තිනො නො විනස්සරෙ.

161. රාජෙඞ්ගිත 'මජානන්තා මන්තිනො'දන්තදන්තිනො,
තිසත්ති චතුරො පායො'පෙතමන්තී'ති මෙහි ච,
සමුපෙතස්ස භූපස්ස සිජ්ඣන්ත්‍යජ්ඣාසයා සදා.

162. නරින්දාභි මුඛෙ'වට්ඨානෙ කණ්ණෙ මන්තං කරෙය්‍ය මා,
යථා රාජාසයං සුද්ධං වචනං දෙය්‍ය සච්චතො.

---

158 දිවාරත්තිං, දිවාරෑදෙක්හි; දිප්පමානා, බබලන්නාවූ; දිස්සන්තා, පෙනෙන්නාවූ; රවින්දුසන්නිභා, හිරසඳුබඳුවූ; සුරා, දෙවිවරු; නත්ථි, වෙනනැත්තාහ; ඊදිසානං, මෙබන්දන්ටත්; රාහුතො, රාහුකෙරෙන්; භයං, බිය; හොති එව, වේ මැයි.

159 අපාපබද්ධචිත්තස්ස, පාපයෙහිනොබැඳුනසිත්ඇත්තාහට; ආදීනවො, පමාවැරැද්දක්; උපජායතෙ අපි, පැමිණියේද; වත්තෙ අසත්තං, වක්ත්‍රයෙහි (මුවෙහි) නොනැවරුනාවූ; කරෙසත්තං, අතනැවරුණු; විසං ඉව, විෂයක්මෙන්; අඝං, දුකක්; වෙ, එකාන්තයෙන්; නකරොති, (ඕහට) නොකෙරේ.

160 අනලවෙමජ්ඣෙ, වහ්නිමධ්‍යයෙහිවූ; සීතානිලානං, සිහිල්පවන්; අවිනස්සනං ඉව, නොනසින්නාක්මෙන්; සත්ත, පණ්ඩිතවූ; රාජන්තිකං, රජුන්වෙත; පත්ත, පැමිණියාවූ; මන්තිනො, මන්ත්‍රීහු; නො විනස්සරෙ, නොනැසෙත්.

161 රාජෙඞ්ගිතං, රජුන්ඉඟි; අජානන්තා, නොදන්නාවූ; මන්තිනො, මැතිවරුද; අදන්තදන්තිනො, දත්නැතිහස්තීහුද; තිසත්ති, ත්‍රිශක්තිය හා; චතුරොපාය, චතුරුපායයෙන්ද; උපෙත, යුක්තවූ; මන්තීහි, මන්ත්‍රීහු දූසි යන; ඉමෙහි, මෙහි රාජොපකරණයන්ගෙන්; සමුපෙතස්ස, යුක්තවූ; භූපස්ස, රජහුගේ; අජ්ඣාසයා, අදහස්; සදා, හැමකල්හි; සිජ්ඣන්ති, සිදුවෙත්.

162 නරින්දාභිමුඛෙ, නිරිඳුන් ඉදිරියෙහි; අවට්ඨානෙ, නිකරුණෙහි; කණ්ණමන්තං, කණට කෙඳිරීම; මා කරෙය්‍ය, නොකරව්; යථාරාජාසයං, රජුන් අදහස්ලෙස; සච්චතො, සත්‍යවශයෙන්; සුද්ධං වචනං, පිරිසිදුබස්; දෙය්‍ය, දෙව්; (කියව්).

163. ලොකනාථා ලොකභණ්ඩ රජනාථාධිපච්චිතා,
කපිනාවික මන්තිස්ස වත්තන්ති සබ්බසත්තියා.

164. කාරියං කිඤ්චි නාපිපි සෙවනං රජමන්තිනං,
නිච්චං ජනානං වජ්ජූනං ධාරණාය නිබන්ධනං.

165. භූපාලසෙවී නාසන්නං වා'දූරං'ව විසීවනං,
යොනිසො මනසී කත්වා'රගරාජං'ව සෙවථ.

166. කුද්ධස්ස රඤ්ඤො'භිමුඛෙ භාසමාන'න්තරන්තරා
හීයන්ති සිරියා සිත්ථ විලීනං'වග්ගිනො'න්තිකෙ.

167. රාජච්චාගා විනාසෙඤ්ඤත කිච්ඡුණ්හා නාපගච්ඡති,
හිමපාතා සත්තාසමෙමා විනා වුද්ධ්‍යා නසම්මති.

168. රාජෙ'ච්ඡිතං ජීවිතෙච්ඡා ජනා භුවි න හිච්ඡථ,
දීපෙ පතිත්වා තං හොති සලභානං 'ව නස්සනං.

---

163 ලොකභණ්ඩ, සබ්බලොකනැම්භිබ්ඹුනා; රජනාථාධිප, රජුන් නැමගිනෙනුකානායකයාගෙන්; අච්චිතා, පුජිතවූ; ලොකනාථා, ලොක නැමගිනැව; කපි, වානරවූ; නාවිකමන්තිස්ස, නාවිකමන්ත්‍රිහුගේ; සබ්බසත්තියා, උගත් ශාස්ත්‍රශක්තියෙන්; වත්තන්ති, පවතිති.

164 කිඤ්චිකාරියං නාපිඅපි, කිසිකරුණක්නැතිනමුත්; රජමන්තීනං, රජුන්හා ඇමත්‍යයන්ද; නිච්චං, නිතර; සෙවනං, සෙවීම; ජනානං, ජනයන්ගේ; වජ්ජූනං ධාරණාය, ධනාරක්ෂණයට; නිබන්ධනං, මනාකරුණකි.

165 භූපාලසෙවී, රජසෙවකයෙනි; නාසන්නං, නොළංව; අදූරං, නුදුරුව; විසීවනංව ඉව, ගිනිතැපීමක් මෙන්ද; යොනිසො, නුවනින්; මනසිකත්වා, මෙනෙහිකොට; උරගරාජංඉව, සර්පරාජයෙක්මෙන්; සෙවථ, (රජුන්) සේවනය කරව්.

166 කුද්ධස්ස, කිපියාවූ; රඤ්ඤො, රජු; අභිමුඛෙ, ඉදිරියෙහි; අන්තරන්තරා, අතරතුරෙහි; භාසමානා, බණන්නෝ; සිරියා, ඉසුරෙන්; හීයන්ති, පිරිහෙත්; කෙසේදයත්? අග්ගිනො'න්තිකෙ, වහ්න්‍යාසන්නයෙහි; සිත්ථවිලීනං ඉව, ඉටි ඉසිරෙන්නාක්මෙනි.

167 රාජච්චාගාවිනා, රජපරිත්‍යාගයෙන්මුත්; අසෙඤ්ඤත, අතිකතිත් හෝ අතිකොසුගෙන්; කිච්ඡුණ්හා, දුක්ගිම; නාපගච්ඡති, පහනොවේ; වුද්ධ්‍යාවිනා, වැස්සෙන්මුත්; හිමපාත, හිමිගිමෙන්; සත්තාසමෙමා, සත්වයන්ගේ ගිම; නසම්මති, නොසන්සිඳේ.

168 භුවි, ලොකයෙහි; ජීවිතෙච්ඡා, පණට ආලයඇති; ජනා, ජනයෙනි; රාජෙච්ඡිතං, රජුන් ඕනෑකරණලද්ද; නහිච්ඡථ, ඕනෑ නොකරව්;

169. කාචා'පි භුවි භාසන්ති සොණ්ණභාජනසඞ්ගතා,
සොණ්ණමෙරුං සිතා සත්තා තබ්බණ්ණාව භවන්ති තෙ.

170. රඤ්ඤෙ පකුප්පිතෙ තස්මා'පෙත්වා මුච්චන්ති ඤාණිනො,
සරප්පහාරං වාරෙන්ති දිස්වා'යන්තං විචක්ඛණා.

171. ආච්ඡාදනං බන්ධනඤ්ච සජ්ජනං සයනාසනං,
රාජපදනෙසෙව'කම්පි ජීවිතෙච්ඡා කරෙථ මා.

172. නරින්දන්තර කම්මන්ත 'ජානිත්වා බහුභාණිනො,
පිලන්ධනෙ පිලන්ධිත්වා තලාකකීළකා විය.

173. රඤ්ඤො තෙජො පරක්කන්ති ගුණඤ්ඤාණස්සිරීමතො,
නා'රිනෙ'දයති 'වාඤ්ඤං දීපං පවිසිතො තමො

---

තං, ඒපැනිම; දීපෙ, පහනෙහි; පගිත්වා, වැටී; සලභානං, පලඟැටියන් ගේ; නාසනං ඉව, නැසීමමෙන්; හොති, වේ.

169 භුවි, ලෙව්හි; සොණ්ණභාජනසඞ්ගතා, රත්බඳුන් ඇසුරුකළාවූ; කාචාපි, කදුත්; භාසන්ති, බබලත්; සොණ්ණමෙරුං සිතා, රත්මෙර ඇසුරුකළාවූ; තෙ සත්තා, ඒ සත්වයෝ; තබ්බණ්ණාව, තවර්ණවත්හුම; භවන්ති, වෙත්.

170 රඤ්ඤෙ, රජු; පකුප්පිතෙ, ප්‍රකුපිතකල්හි; තස්මා, එතැනින්හෝ ඔහුගෙන්; අපෙත්වා, පහව; ඤාණිනො, නුවනැතියෝ; මුච්චන්ති, මිදෙත්; විචක්ඛණා, සුධීහු; ආයන්තං, තමාකරාඑන්නාවූ; සරප්පහාරං, හී පහර; දිස්වා, දැක; වාරෙන්ති, වළකත්.

171 ආච්ඡාදනං, ඇඳීමද; බන්ධනංච, බැඳීමද; සජ්ජනං, සැරසීමද; සයනාසනං, නිදීම හිඳීමද යන; රාජපදනෙසු, රජවරිතයන්අතුරෙන්; එකම්පි, එකකුත්; ජීවිතෙච්ඡා, ප්‍රාණාලයඇත්තෝ; මාකරෙථ, නොකරව්.

172 නරින්ද, නිරිඳුත්ගේ; අන්තරකම්මන්ත, සිත්තුළඇති අදහස් (ක්‍රියා); අජානිත්වා, නොදැන; බහුභාණිනො, බොහෝකොටදොඩන්නෝ; පිලන්ධනෙ, ආභරණයන්; පිලන්ධිත්වා, පැලඳගෙණ; තලාකකීළකා විය, විල්කෙළි කෙළින්නාවුන්මෙනි.

173 තෙජො, තෙදද; පරක්කන්ති, පරාක්‍රමයද; ගුණඤ්ඤාණ, ගුණ නුවනද; සිරිමතො, ඉසුරුදඇති; රඤ්ඤො, රජහට; අරී, හතුරෝ; න, නැත්තාහ; ඉතෙ, හිරු; උදයන්ති, පායනකල්හි; තමො, අඳුරු; අඤ්ඤං දීපං, අන්‍යවීපයකට; පවිසිතො ඉව, පිවිසියාක් මෙනි.

174. දෙවෙසු වත්තතී සච්චං ජන්තුතුණ්ඩෙ මුසං තතො,
ලොකෙ සුර සමා හොන්ති ලොකෙසු සච්ච වාදිනො.

175. නිද්ධනො'පි ජනො පුඤ්ඤ වන්තං සන්තං සුතං ලභෙ,
චින්තාමණිම්හි ලද්ධෙ'ව හොත්‍ය'මන්ද බිලස්සිරි.

176. භත්තෙන'ත්ථො නත්ථි නානා පච්චනා'භිගිතිං කරෙ,
මා'භිත්ථද්ධා හොථ දස කතදෙසප්පමානතො.

177. තෙජීව භුවි පූජෙන්ති කුලස්සුණගුණම්පි,
නත්වා වන්දං වාරමෙකං සබ්බදෙතං'ව වන්දනං.

178. භවාභවං සංසරන්ති භවබන්ධනබන්ධිතා,
දීපො'ව දිට්ඨදීපානං පාණං නිබ්බාති පාණිනො.

---

174 සච්චං, සත්‍යය; දෙවෙසු, දෙවියන්කෙරෙහි; වත්තති, පවතී; මුසා, බොරු; ජන්තුතුණ්ඩෙ, ජනයන්තුඩ පවතී; තතො, එහෙයින්; ලොකෙ, ලෙව්හි; ලොකෙසු, ජනයන්අතුරෙහි; සච්චවාදිනො, සත්‍යවාදීහු; සුරසමාහොන්ති, දෙවියන් බඳුවෙත්.

175 නිද්ධනො, ධනහීනවූ; ජනොපි, ජනතෙමේත්; පුඤ්ඤවන්තං, පිනැති; සන්තං, සත්පුරුෂවූ; සුතං, දරුවෙකු; ලභෙ, ලබයි; චින්තාමණිම්හි, සිතුමිණ; ලද්ධෙ, ලත්කල්හි; අමන්ද, නොමඳ; අබිලස්සිරි, සියළු ඉසුර; හොති එව, වේමැයි.

176 ආපච්චනා නානා, පැසීම දක්වාමුත්; අභිගතිතිං කරෙ, ඉනාතිනි කෙළේනම්; භත්තෙන, බතින්; අත්ථොනත්ථි, වැඩක්නැත; දසකත, දස යත්විසින් කළාවූ; දෙසප්පමාණතො, වදූප්‍රමාණයට වඩා; අභිත්ථද්ධා, ඉනාතදබැව් ඇත්තෝ; මා හොථ, නොවව්.

177 කුලස්සුණගුණෙ, වංශසුණගුණධර්මයෝ; අප්පිපි, විද්‍යමානවූවත්; භුවි, ලොකයෙහි; තෙජීව, තෙදැතියත්ම; පූජෙන්ති, ගරුකොටසලකත්; එකං වාරං, එක්වරක්; වන්දං, වන්දනා; නත්වා, වැඳ; සබ්බදා, සැමකල්හි; ඉතං, සුයතිනා; වන්දනං ඉව, වැඳිම මෙනි.

178 පාණිනො, සත්වයෝ; භවබන්ධනබන්ධිතා, බවබඳිනින් බැඳුනාහු; භවාභවං, භවයෙන්භවයට; සංසරන්ති, සැරිසරාඇවිදිත්; දිට්ඨදීපානං, දුටුනිවන්ඇති රහතුන්ගේ; පාණං, ප්‍රාණය; දීපොව, කුප්‍රීරප්‍රදීපයක්මෙන්; නිබ්බාති, නිවේ.

179. නො ඣායතීසම්පි පාණ හරස්සාඝස්ස ඉන්ධනා,
ඣායතෙ ඉන්ධනානෙව ඡවස්ස ගහිතග්ගහිනො.

180. සූයතෙ යොජනං භෙරිද්ධන්‍යසන්‍යාව බාරස,
දානද්ධනී දායකානං තිලොකම්පි සූයති.

181. සබ්බපුප්ඵසුගන්ධා'නුවාතං ගච්ඡති නාගතො,
සීලගන්ධො සතං සබ්බ දිසා වාති නිරන්තරං.

182. අප්පත්තබ්‍යත්තමජ්ඣත්ත සත්තං පත්තා සහං සුධී,
ගෙහෙ'න්ධිතෙසඤ්ඤුට්ඨපිත භණ්ඩානං'ව ගවෙසකා

183. හිත්වා 'මතවචො ඉන්ධ බරවාදකදුජ්ජනා,
හිත්වා සුපක්කෙ විරස ඵලානං ඛාදකා විය.

---

179 පාණහරස්ස, පරපණනසන්නාහට; අඝස්ස, දුක්ඛයාගේ හෝ පාපයාගේ; ඉන්ධනා, තදබව; ඊසම්පි, මඳකුදු; නඣායති, නොහැගේ; ගහිතග්ගහිනො, ඇවිලිගත් ගිනිඇති; ඡවස්ස, මළකඳට; ඉන්ධනා, (ගින් නෙති) තදබව; නඣායතෙ එව, නොහැගේ මැයි.

180. භෙරිද්ධනි, බෙරහඬ; යොජනං, යොදුනක්; සූයති, ඇසේ; අසන්‍යාව, අසනිධ්වනිය; බාරස, දෙළොස් යොදුනක් ඇසේ; දායකානං, දන්දෙන්නන්ගේ; දානද්ධනි, දානධ්වනිය; තිලොකං අපි, තෙලොවටම; සූයති, ඇසේ.

181 සබ්බපුප්ඵසුගන්ධො, සියළු මල්සුවඳ; අනුවාතං, පවන් අනුව; ගච්ඡති, යයි; නාගතො, පෙරටුව නොයයි; සතං, සාධුන්ගේ; සීලගන්ධො, සිල්සුවඳ; නිරන්තරං, නිරතුරුව; සබ්බදිසා, සියලුදික්හි; වාති, හමයි.

182 අප්පත්ත, නොපැමිණියාවූ; බ්‍යත්ත, ව්‍යක්තයන්හා; මජ්ඣත්ත සත්තං, මධ්‍යස්ථජනයන්ඇති; සහං, සභාවට; පත්තා, පැමිණියාවූ; සුධී, සුධීහු; අන්ධිතෙ, අන්ධකාරවත්වූ; ගෙහෙ, ගෘහයෙහි; අඤ්ඤුට්ඨපිත, අන්‍යයන්තැබූ; භණ්ඩානං, බඩු; ගවෙසකා ඉව, සොයන්නන් මෙනි.

183 අමතවචො, අමාවැනිබස්; හිත්වා, හැර; ඉන්ධ, තදවූ; ඛර, කර්කශවූ; වාදක, බස්කියන්නාවූ; දුජ්ජනා, නපුරුජනයෝ; සුපක්කෙ, විලිකුත් මියුරුපල; හිත්වා, හැර; විරසඵලානං, අමධුරඵලයන්; ඛාදකාවිය, කන්නන්මෙනි.

184. සුරාසොණ්ඩා නො ජහන්ති කිත්තකො'වාදිතා පි තං,
මත්තස්ස කත සඤ්ඤස්ස හාසියො ගමනං විය.

185. සුරං පිත්වාන රහසි තුණ්හීයා'සීනො'පි සංසදෙ,
මුඛාකිණ්ණකථාපෙත්වා සෙ'ව ඤාපෙති තග්ගතිං.

186. පරපාණහරා'සාධු නිජපාණා න රක්ඛකා,
විසං ගිලිත්වා මධුනං ජීවිතායෙවාව ලෙහකා.

187. දෙහං වහිත්වානෙකත්ථ චරිත්වා පාණනාසනං,
කතං වු'ත්තරකුරුකා යක්ඛෙහි නරවාහනං.

188. සුරාසොණ්ඩා'මනුදුක්ඛං ඨපෙත්වා සම්පරායිකං,
ඉධෙව දුක්ඛං වින්දන්ති 'යතිදුක්ඛනිමිත්තතො.

189. පාපිට්ඨා 'ධීතධම්මා'පි තත්ථ සත්තං න තම්මතං,
මීනාදබිට්ඨා'පි ලොණමප්පත්තං විය තත්තනුං.

---

184 සුරාසොණ්ඩා, රාසොඩනු; කිත්තකො'වාදිතාපි, කොතෙක් අවවාද දෙනලද්දාහුනමුත්; තං, ඒසුරාපානය; නොජහන්ති, නොහරිත්; කත සඤ්ඤස්ස, කලසන් ඇති; මත්තස්ස, මත්වූ; හාසියො, ඇතෙනුගේ; ගමනං විය, යාම මෙනි.

185 රහසි, නොදන්වා; සුරං පිත්වාන, රාබී; සංසදෙ, සබාමැද; තුණ්හී, නිශශබ්දව; ආසීනොඅපි, උන්නේද; මුඛාකිණ්ණ, මුඛාකිණ්ණවූ; (මුවතුළ ඉසුරුනාවූ;) සාඑව, ඒසුරාවම; කථාපෙත්වා, බිබවකියවා; තග්ගතිං, ඒගතිය; ඤාපෙති, ලොවට හඟවයි.

186 පරපාණහරා, මෙරමා පණ නහන්නාවූ; නිජපාණානං, සවකීය ප්‍රාණයන්; රක්ඛකා, රකින්නාවූ; අසාධු, දුර්ජනයෝ; විසං ගිලිත්වා, විස ගිල; මධුනං, මී; ජීවිතාය, දිවිත්; අවලෙහකාඉව, ලොවින්නාවුන්මෙනි.

187 දෙහං, සිරුර; වහිත්වා, උසුලාගෙණ; අනෙකත්ථ, නොයෙක් තැන; චරිත්වා, හැසිර; පාණනාසනං, පරපණනැසීම; උත්තරකුරුකා යක්ඛෙහි, උතුරුකුරුදිවයින යකුන්විසින්; නරවාහනං, මනුෂ්‍ය වාහනය; කතං ඉව, කරණලද්දක් මෙනි.

188 සුරාසොණ්ඩා, රාසොඩනු; සම්පරායිකං, පරලොවවිපාකදෙන්නාවූ; අමනුදුක්ඛං, ඉදිරියෙහිවූ දුක; ඨපෙත්වා, තබා; ආයතිදුක්ඛ, භවිෂ්‍යත්, දුකට; නිමිත්තතො, නිමිතිවශයෙන්; ඉධෙව, මෙලොවෙහිම; දුක්ඛං, දුක්; වින්දන්ති, විඳිත්.

189 පාපිට්ඨා, අතිපාපයෝ; අධීතධම්මාපි, හදාළධර්මඇත්තාහුද; තම්මතං, ඔවුන්සිත; තත්ථ, ඒධර්මයෙහි; නසත්තං, නොඇලෙනලද්දේවේ;

190. සුරානම්පි තා'රීනං සඞ්ඛා සමූලඝාතනං,
තමෝරිගාහං නාසක්ඛි චතුද්දීපම්පි ධාවිතො.

191. මන්තිමජ්ඣෙ භාති රාජා'සෙසාභරණභූසිතො
තතො'ධිකතරං භාති යුද්ධමණ්ඩලමජ්ඣගො.

192. ලොණොදනොදකග්ගන්නා ජනාරක්ඛාය නිස්සයා,
තථාපි නිස්සයො නාම මජ්ඣත්තරාජනිස්සයො.

193. රවින්දුරඤ්ජනාකාර රඤ්ජනං තමසො න හි,
ලොකපාලක රාජානො විය රාජෙන්ති නාපරෙ.

194. නරින්ද මන්දපුඤ්ඤස්ස දදෙය්‍යුම්පි ධනස්සිරිං,
අතෙලමල්ලිකාදීපා විය වත්තන්ති නො චිරං.

---

මීනා, මත්ස්‍යයෝ; උදධිට්ඨාපි, සාගරස්ථවූනමුත්; තත්තානුං, ඔවුන් සිරුරට; ලොණං, ලුණු; අප්පත්තං විය, නොපැමිණියාක් මෙනි.

190 අරීනං, සතුරන්ගේ; සමූලඝාතනං, සමූලොච්ඡෙදනය; සුරානං අපි, දෙවියන්විසිනුත්; නසක්ඛා, නොහැකිවනුලැබේ; චතුද්දීපංපි, සතර මහද්විපයිනටත්; ධාවී, දුවනසුළු; ඉනො, සූර්‍ය්‍යතෙම; තමොරිගාහං, අන්ධකාරශත්‍රුග්‍රහණය; නාසක්ඛි, නොහැකිවී.

191 රාජා, රජතෙම; අසෙසාභරණ, සර්වාභරණයෙන්; භූසිතො, සැරසෙනලද්දේ; මන්තිමජ්ඣෙ, ඇමතියන්මැද; භාති, බබලයි; යුද්ධමණ්ඩලමජ්ඣගො, රණමඩුලුමැදට පැමිණියේ; තතොධිකතරං, ඊටත්වඩා අධිකව; භාති, බබලයි.

192 ලොණ, ලුණු; ඔදන, බත; උදක, ජලය; අග්ගි, ගිනි; අන්නා, ධාන්‍ය යනමොහු; ජනාරක්ඛාය, සත්ත්වාරක්ෂාවට; නිස්සයා, ප්‍රතිෂ්ඨාභූයි; තථාපි, එතකුදුවුවත්; නිස්සයොනාම, නිශ්‍රයනම්; මජ්ඣත්තරාජනිස්සයො, මධ්‍යස්ථරජුන්ගේ නිශ්‍රයමැයි.

193 රවින්දු, ඉරසඳ; රඤ්ජනාකාර, බබලනලෙසින්; රඤ්ජනං, බැබලීමක්; තමසො, අඳුරට; න හි, නැති; ලොකපාලක, ලෝරක්නාවූ; රාජානොවිය, රජුන්මෙන්; අපරෙ, අන්‍යයෝ; න රාජෙන්ති, නො බබලත්මැයි.

194 නරින්ද, නිරිඳෙනි; මන්දපුඤ්ඤස්ස, මදපිණැතියෙකුට; ධනස්සිරිං, වස්තුසම්පත්; දදෙය්‍යුම්පි, දුන්නාහුනමුත්; අතෙල, තෙල්නැති; මල්ලිකා, පියල්ලෙන් (ගත්); දීපාවිය, ප්‍රදීපයන්සෙයින්; චිරං, බොහෝකාලයක්; නොවත්තන්ති, නොපවතිත්.

195. සච්චානි රඤ්ඤං විහසන්තාමෙත්තං චිත්තංජනොද්ධතා;
හිමදම්පදඨ්ගෙහා උබ්බාහු මුත්තා'ව ගණ්හිතුං.

196. රාජා රාජති රට්ඨෙ'ව පර රට්ඨෙ දිවෙන්දු'ව;
කවී විදෙසං පත්තො'පි පුණ්ණින්දු'ව විරාජතෙ.

197. සබ්බඞ්ගං පස්සමාන'ක්ඛි විනා'දාසං නදිස්සතෙ;
ඤාණීනං දස්සනං රඤ්ඤං මන්ත්‍යාදාසෙන සිජ්ඣතෙ.

198. අන්ධං තමාපයාතං'ව චන්දනිස්සාය රත්තියං;
මජ්ඣත්තරාජෙ නිස්සාය 'සන්තමො'පෙති සත්තතො.

199. මන්තී ඤාණී ගුණී රඤ්ඤං නත්ථි චෙ අනුසාසකා;
තෙ'මිතෙස්සරියෙවා'පි අනත්ථායන්ති'මිතා'රිතො.

---

195. රඤ්ඤං, රජුන්ගේ; මෙත්තං චිත්තං, මෛත්‍රීසිත; සච්චානි, සැබෑයයි; විහසන්තා, සිනාසෙන්නාවූ; උද්ධතා ජනා, උඩඟු ජනයෝ; හිමදම්ප, ත්‍රිමද හස්තියකුගේ; දාඨග්ගා, දළ අගින්; මුත්තා, මුතු; ගණ්හිතුං, ගනු පිණිස; උබ්බාහු ඉව, එසැවූ අත් ඇත්තන් මෙනි.

196. රාජා, රජතෙම; රට්ඨෙව, සියරටෙහිම; රාජති, බබලයි; පර රට්ඨෙ, නොරටෙහි; දිවෙන්දුව, දවල්සඳමෙනි; කවි, පණ්ඩිතජනතෙම; විදෙසං පත්තොපි, නොරට ගියේද; පුණ්ණින්දුඉව, පුන්සඳමෙන්; විරාජතෙ, බබලයි.

197. සබ්බඞ්ගං, සර්වාංගය; පස්සමානක්ඛි, බලන ඇස; ආදාසං විනා, කැටපතින්මුත්; නදිස්සතෙ, නොපෙනේ; ඤාණීනං දස්සනං, නැණැතියන් දැක්ම; රඤ්ඤං, රජුන්ගේ; මන්ත්‍යාදාසෙන, මැතිනැමති කැටපතින්; සිජ්ඣතෙ, සිදු වේ.

198. රත්තියං, රාත්‍රියෙහි; චන්දං නිස්සාය, සඳනිසා; අන්ධං තමං, ඝනාන්ධකාරය; අපයාතං ඉව, ඉවතයාම මෙන්; මජ්ඣත්තරාජෙ, මැදහත් රජුන්; නිස්සාය, නිසා; අසන්තමො, දුකඳුර; සත්තතො, වැසියන්කෙරෙන්; අපෙති, ඉවත් වේ.

199. රඤ්ඤං, රජුන්ට; අනුසාසකා, අනුශාසනාකරන්නාවූ; ඤාණී, ඥානවත්වූ; ගුණී, ගුණවත්වූ; මන්තී, මන්ත්‍රීහු; නත්ථි චෙ, ඉදින් නැත්තාහුනම්; අමිතෙස්සරියෙවාපි, අප්‍රමාණ ඉසුරුඇත්තාවූද; තෙ, ඒරජුන්කරා; අරිතො, සතුරන්ගෙන්; අමිතා, අප්‍රමාණවූ; අනත්ථා, අවැඩ; එන්ති, පැමිණෙත්.

200. රඤ්ඤො ජනපදගාමා සබ්බසම්පත්ති චත්ථිපි ;
නත්ථි චෙ යොධසෙනෙන්දූළූහිවා'පරිවාරිතො.

201. රජතො පත්තසම්පත්තිසත්තො තතොව නස්සති ;
යථා'පි ජලජං ලොණං ජලතොව විලීයතෙ.

202. වඩ්ඪන්තෙන සිරියා රඤ්ඤො සියා ලොකස්ස වඩ්ඪනං ;
සසඞ්කෙ වඩ්ඪමානම්හි සසඞ්කස්සෙව වඩ්ඪනං.

203. නරින්ද කතපුඤ්ඤස්සෙ දිස්වෙව දිබ්බ චක්ඛුනා ;
මනාපා ඛණෙන තෙ තෙව තං තං නෙන්ති හිතා'හිතං.

204. රඤ්ඤං විරුද්ධෙහි සහා'බ්‍යත්තා ච ධරමානකා ;
හත්ථසඤ්ඤාය අත්තාන මුපව්හයන්තෙව මච්චුනො.

205. සන්ථවො'ති චිරං මනාපා 'ලස්‍යං තෙ'සම්පි මඤ්ඤථ ;
වඩ්ඪිතො පයසාපි'හි තක්කිසං හොති නාඤ්ඤථා.

---

200. රඤ්ඤො, රජහට; ජනපදගාමා, දනව් හා ගම්ද; සබ්බසම්පත්තිච, සර්වසම්පත්තියත්; අත්ථි අපි, විද්‍යමානවුවත්; යොධසෙනා, බල සෙන්; නත්ථිචෙ, නැත්නම්; උලූහි, තාරකාවන් විසින්; අපරිවාරිතො, නොපිරිවැරූ; ඉන්දුව, චන්ද්‍රයා මෙනි.

201. රජතො, රජ්ජත්ගෙන්; පත්තා, ලබනලද; සම්පත්ති, ඉසුරු ඇති; සත්තා, ජනතෙම; තතොඑව, ඒ රජ්ජත්ගෙන්ම; නස්සති, නැසේ; ජලජං, දියෙන් උපන්නාවූ; ලොණං, ලුණු; ජලතොව, ජලයෙන්ම; යථාපි; විලීයතෙ, යම්සේදියව ඉසිරේද (එමෙනි).

202. රඤ්ඤො, රජු; සිරියා, ඉසුරෙන්; වඩ්ඪන්තෙන, වැඩෙනකල්හි; ලොකස්ස, ලොකයාගේ; වඩ්ඪනං සියා, වැඩීම වන්නේය; සසඞ්කෙ, චන්ද්‍රයා; වඩ්ඪමානම්හි, වැඩෙනකල්හි; සසඞ්කස්ස, ශශලාඤ්ඡනයා; වඩ්ඪනං ඉව, වැඩීම මෙනි.

203. නරින්ද, නිරිඳු; කතපුඤ්ඤස්සෙ, කළ පින්පව් ඇත්තාන්; දිබ්බ චක්ඛුනාඉව, දිවැසින් මෙන්; දිස්වා, දැක; මනාපා, දූත; තං තං හිතාහිතං, ඒ ඒ අභිවෘද්ධිහානිකට; තෙතෙව, ඒ ඒ ජනයන්ම; ඛණෙන, ඇසිල්ලකින්; නෙන්ති, පමුණුවත්.

204. රඤ්ඤං, රජ්ජත්ට; විරුද්ධෙහි සහ, විරිදුන් සමග; ධරමානකා, දව සරින්නාවූ; අබ්‍යත්තා, අඥානයෝ; මච්චුනො, මරුවාහට; හත්ථසඤ්ඤාය, අතවැනීමෙන්; අත්තානං, තමන්වෙත; උපව්හයන්තාව, කැඳවන්නාන් මෙනි.

205. චිරං, වැඩිකලක්; සන්ථවොහි, පරිචිතයයි; මනාපා, සිනා; ආලස්‍යං, අලසබව; ඊසම්පි, මදකුත්; නාමඤ්ඤථ, නොහඟිව්; අති, සජීයා;

206. සිප්පා'පදෙසොත්තාභයෙ දෙන්තා'මෙ චතුරොත්තමා;
පියො පිතා'ත්තනො වෙ'ති පිතරො හොන්ති පඤ්ච'මෙ.

207. විනෙන්ත' ධම්මම්පක්ඛිප්ප සන්තෙ ධම්මෙන රක්ඛකා;
සුඛං වසිත්වා'භයත්ථ පුනො'පෙන්ති සිවං පුරං.

208. කිච්චං පටිච්චා 'කම්මඤ්ඤෙ මච්චෙ මිලෙන්ති 'වෙ ජනා;
නක්ඛත්තයොගා'ප්පයුජ්ජා 'භිජිත මිලනං යථා.

209. තපො වයො වංස ඤාණ ගුණා' තිසූරතාදිහි;
සමිද්ධ ලොකතො ලොකෙ විරාජන්ති ධනී'ධිකං.

210. සමෙතුං පාණිසංඛ්‍යාය නික්ඛන්තායෙ'කඡිද්දතො;
දිබ්බක්ඛිනො 'ලොකිතා'පි අප්පකා ජම්බුදීපකා.

---

පයසා, කිරෙන්; වඩ්ඪිතොපි, වැඩුණේද; නිම්බිසං, ඔහුවිෂ, අඤ්ඤථා නොහොති; වෙනස් නොවේ.

206. සිප්ප, ශිල්පය; උපදෙස, උපදෙස්ය; උත්ත, හිත බස්ය; අභයෙ, නිර්භය යන මේදෑ; දෙන්තා, දෙන්නාවූ; ඉමෙ චතුරොත්තමා, මේ සිව් උතුමෝද; අත්තනො, තමන්ගේ; පියො, ප්‍රියවූ; පිතාච ඉති, පියා දැයි යන; ඉමෙ පඤ්ච, මේ පස්දෙන; පිතරො හොන්ති, පිය වරු වෙත්.

207. විනෙන්ත, හික්මෙති; අධම්මං, පවක්; අපක්ඛිප්ප, නොලා; ධම්මෙන, දැහැමින්; සන්තෙ, ජනයන්; රක්ඛකා, රකින්නෝ; උභයත්ථ, දෙලෙව්හිම; සුඛං, සුවසේ; වසිත්වා, වැස; පුන, නැවත; සිවං පුරං, නිවන්පුර; උපෙන්ති, පැමිණෙත්.

208. ජනා, ජනයෝ; කිච්චං පටිච්ච, කටයුත්තක් පිණිස; අකම්මඤ්ඤෙ, කම්ක්ෂම නොවූ; මච්චෙ, මිනිසුන්; වෙ, ඉදින්; මිලෙන්ති, යොදත්ද; (එය) නක්ඛත්තයොග, නැකැත් යොගයෙහි; අප්පයුජ්ජ, නොයෙදියයුතු; අභිජිත, අභිජිත්නක්ෂත්‍රයාගේ; මිලනං යථා, එකතුකිරීම මෙනි.

209. තපො, තපස්ය; වයො, වයස්ය; වංස, කුලය; ඤාණ, නුවණය; ගුණ, කරුණාදිගුණය; අභිසූරතා, වික්‍රමය; ආදීහි, මේ ආදියෙන් සමිද්ධ, සමෘද්ධවූ; ලොකතො, සත්වයන්ට වඩා; ධනී, ධනවන්තයෝ; ලොකෙ, ලෙව්හි; අධිකං විරාජන්ති, වැඩියක් බබලත්.

210. එකඡිද්දතො, එකසිදුරකින්; නික්ඛන්තාය, නික්මුනාවූ; පාණි සඞ්ඛ්‍යාය, සත්වසඞ්ඛ්‍යාවහා; සමෙතුං, සමකිරීමට; දිබ්බක්ඛිනා, දිවැසින්; ඔලොකිතා අපි, බලනලද්දාහු නමුත්; ජම්බුදීපකා, දඹදිව් වැස්සෝ; අප්පකා, ඊටවඩා ස්වල්පවෙත්.

211. සත්තා කීව මහන්තාපි ලඝවො හොන්ති යාචකා ;
බලිතො හරි භූමිදාන මාදය වාමනො'භවී.

212. සජ්ජනෙ'කෙ කතෙ භෙදෙ සතවජ්ජං තිතික්ඛති ;
කතෙ 'මන්දෙ දුජ්ජනො'පෙ 'ප්‍යෙකවජ්ජෙන භිජ්ජති.

213. සජ්ජනා සජ්ජනගුණෙ ජානන්ති නෙව දුජ්ජනා ;
පාසාණ මජ්ඣෙ හෙමස්ස ඥණීනො ඥණීනො විය.

214. දින්නං බ්‍යත්තෙනධෙව වාගං පරිවත්තිය ලබ්භති ;
ලොණම්බුජ වුට්ඨිනං'වා 'වන්ධා ලොකං නදංගති.

215. සෙවෙය්‍ය චුත්තමෙ නිච්ච මනප්පිස්සරියං ලභෙ ;
මෙරුං සිතා' සෙසසත්තා තබ්බණ්ණා'ව භවන්ති තෙ.

216. එද්ධරුද්ද ගුණී සෙවී නෙව හායන්ති සජ්ජනා;
කුරුරග්‍යන්තරං පත්තො පවනො නො විනස්සතෙ.

---

211. කීවමහන්තා අපි, ගුණයෙන් කොපමණ මහත්වූද; සත්තා, සත්වයෝ; යාචකා, ඉල්වන්නෝ; ලඝවො හොන්ති, ලඝුවෙත්; හරි, විෂ්ණුතෙම; බලිතො, මහාබලිනම් අසුරයාගෙන්; භූමිදානං, බිම්දන; ආදාය, ගෙණ; වාමනො අභවී, ලකුණ්ඨකයෙක් වී.

212. එකෙභෙදෙ, එක්සහපනක්; කතෙ, [දනාවිසින්] කළකල්හි; සජ්ජනො, සාධුජනතෙම; සතවජ්ජං, සියක් වරද; තිතික්ඛති, ඉවසයි; අමන්දෙ, නොමදවූ; අපෙ, වැඩික්; කතෙපි, කළ කල්හිත්; දුජ්ජනො, දුදනතෙම; එකවජ්ජෙන, එක්වරදකින්; භිජ්ජති, බිඳේ.

213 සජ්ජනා, සාධුජනයෝ; සජ්ජනගුණෙ, සත්පුරුෂගුණයන්; ජානන්ති, දනිත්; දුජ්ජනා, දුර්ජනයෝ; නෙව, නොදනිත්මය; පාසාණ මජ්ඣෙ, පහන්මැද තිබෙන; හෙමස්ස, සවණීය; ඥණීනො, දන්නාවූ; ඥණීනො විය, ඥණවතුන් මෙනි.

214. බ්‍යත්තා, වියතුනි; දින්නං, අනුත්ව දෙනලද්ද; පරිවත්තිය, ආපසුපෙරලී; ඉධෙව, මෙලොවම; වාගං, පඬුරක්සොට; ලබ්භති, ලැබේ. ලොණම්බුජ, ලුණුදියෙන් උපන්; වුට්ඨිනං, වැසිදිය; ලොකං අවන්ධා; ලොවරුක; නදංගතිව, ඒ ලවණසියට පැමිණීම මෙනි.

215. උත්තමෙ, උතුමන්; සෙවෙය්‍ය වෙ, ඉදින් සෙව්නේ නම්; නිච්චං, නිතර; අනප්පිස්සරියං, අනල්පසම්පත්තිය; ලභෙ, ලබන්නේය; මෙරුං සිතා, මහමෙර ඇසුරුකළාවූ; තෙ අසෙසසත්තා, ඒසියලු සත්හුම; තබ්බණ්ණාව; ඒසවණ් වණ් ඇත්තෝම; භවන්ති, වෙත්.

216. එද්ධ, තදවූ; රුද්ද, රෞද්‍රවූ; ගුණී, ගුණැතියන්; සෙවී, සෙවිනා පුලු; සජ්ජනා, සත්පුරුෂයෝ; නෙව හායන්ති, සියගුණෙන් නොම

217. මෙත්තායිත්වා' විරුජ්ඣිත්වා කතවජ්ජාන මත්තනො,
ලජ්ජාභයං තෙ පාපෙන්තා හිතසිද්ධිං කරෙථ ච.

218. මිලාතෙ කුසුමෙ' මන්ද සුගන්ධි නො පවත්තති,
තථා' සුචරිතං සත්තාගතත්තං'ව ධම්මනිච්ඡවො.

219. පුරෙ පුඤ්ඤ මකත්වාන 'දානි සම්පත්තියෙ'හකා,
බීජෙ'වපිත්වා සොචන්තා දිස්වා'ව ධඤ්ඤමද්දකෙ.

220. කත්තබ්බමවිජානිත්වා' කත්තබ්බං යො කරෙය්‍ය වෙ,
සො වෙ නභෙ ඛිත්තලෙඩ්ඩු පතනංව විපජ්ජති.

221. ජනා'වසෙසිස්සරියං ලභෙය්‍යුං වෙප්‍ය'නප්පකං,
භවත්‍යෙ'ව'ස්සාදථාභාවො මීනානං'ව නවොදකං.

---

පිරිහෙත්; කුරුර, රළුවූ; අග්‍යන්තරං, ගිනිමැදට; පතන්තා, පැමිණියාවූ; පවනො, වාතය; න විනස්සතෙ, (යම්සේ) නොනැසේද; (එමෙනි.)

217. අත්තනො, තමහට; කතවජ්ජානං, කළ වරද ඇත්තන්ට; මෙත්තායිත්වා, මෛත්‍රීකොට; අවිරුජ්ඣිත්වා, නොවැරද; තෙ, ඒකාන්තවශයෙන්; ලජ්ජාභයං, විළිබියට; පාපෙන්තා, පමුණුවමින්; ච, නැවත; හිතසිද්ධිං, අභිවෘද්ධි සිද්ධිය; කරෙථ, කරව්.

218. කුසුමෙ, මල; මිලාතෙ, පරවූ කල්හි; අමන්දසුගන්ධි, බොහෝ සුවඳ; නො පවත්තති, නොපවතියි. තථා, එසේම; අසුචරිතං, මනාසිරිත් නැති; සත්තාගතත්තං, සත්ත්වකායය; ධම්මනිච්ඡවො ඉව, ගැරඬි කුණක් වැනි වේ.

219. පුරෙ, පෙර; පුඤ්ඤං අකත්වාන, පින් නොකොට; ඉදානි, මේ ජාතියෙහි; සම්පත්තියා, සැපත පිණිස; ඊහකා, තැත්කරන්නෝ; බීජෙ අවපිත්වා, බිජුනොවපුට; ධඤ්ඤමද්දකෙ, කොලදිත්කරන්නන්; දිස්වා, දැක; සොචන්තා ඉව, ශොකකරන්නන් මෙනි.

220. කත්තබ්බං, කළමනාදෙය; අවිජානිත්වා, නොදැන; යො, යමෙක්; අකත්තබ්බං, නොකටයුතු දෙය; කරෙය්‍ය වෙ, කෙළේනම්; සො, හෙතෙම; වෙ, ඒකාන්තයෙන්; නභෙ, අහස; ඛිත්තලෙඩ්ඩු, දැමූ කැටක්; පතනං ඉව, වැටීමමෙන්; විපජ්ජති, (ඒකාන්තයෙන්) පිරිහීමට යේ.

221. අවසෙසා ජනා, සෙසුජනකෙනෙක්; අනප්පකං, අනල්පවූ; ඉස්සරියං, සම්පත්තියක්; වෙ අපි, ඉදිනුත්; ලභෙය්‍යුං, ලබන්නාහු නම්; අස්සාදථාභාවො, අනාස්වාදයක්; භවති එව, වේමැ; මීනානං, මත්ස්‍යයන්ගේ [අනාස්වාදයට;] නවොදකං ඉව, ගංවතුර ගැලීමක්මෙනි.

222. ජනා'ප්ප පුඤ්ඤදා' මන්දං නරාමර සිරිං ලභෙ,
වට බීජුබ්භවො රුක්ඛො'රුලතා මණ්ඩපො යථා.

223. ථිරසාරගුණී සබ්බසත්තූපෙක්ඛාව වත්තති,
මෙරු සුරාසුරලොක සම සජ්ජෝ'ච තිට්ඨති.

224. මතෙ පායං සාහසිකෙ පාපිට්ඨෙ'දය ගච්ඡති,
දීපෙ විජ්ඣෙ සබ්බගෙහං තමොක්ඛන්ධා'වටං විය.

225. අභෙත්වා'ලයො පුප්ඵං මාදියන්තා රසං යථා,
භවෙ' භයත්ථො 'බාධෙත්වා සත්තො සුඞ්කෙ පි ඛෙප්පිතෙ.

226. දුක්ඛය්‍යමත්තාසිතානං මීයමානා'පි දෙන්ති නො,
රාවණෙන කණ්ඨස්සස ධාරිතං සිඛඟුසනං.

227. කුරු'භයත්ථං සාධූහි හිත්වානා' සාධවා'මිතා,
නස්සන්තෙ 'වා'ච්චයා සබ්බෙ සිරිතෙජො පරක්කමා.

---

222. ජනො, ජනතෙම; අප්පපුඤ්ඤද, කල මදපිනකින්; අමන්දං, බොහෝවූ; නරාමර සිරිං, දෙව්මිනිස් සම්පත්තිය; ලභෙ, ලබන්නේය; වටබීජුබ්භවො, නුගබිජු වලින් හටගත්; රුක්ඛො, නුගරුක; උරුලතා මණ්ඩපො යථා, විශාල සාමබුලු ඇතිවන්නාක් මෙනි.

223. ථිර, ස්ථිරවූ; සාර, උතුම්වූ; ගුණී, ගුණැති ජනතෙම; සබ්බසත්ත, මුළුසතුන්ට; උපෙක්ඛාව, මධ්‍යස්ථවම; වත්තති, පවතී; මෙරු, මහමෙර; සුරාසුරලොක, දිව්‍යදානව ලොකවලටම; සමසජ්ජා, සමවසැදී; තිට්ඨති එව, තිබේ මැයි.

224. සාහසිකෙ, දරුණුක්‍රියා කරන්නාවූ; පාපිට්ඨෙ, පවිටුජනයා; මතෙ, මළකල්හි; ආදය, රුගෙණ; අපායං, නිරයට; ගච්ඡති, යයි; දීපෙ, පහණ; විජ්ඣෙ, නිවුනකල්හි; සබ්බගෙහං, මුලුගෙය; තමොක්ඛන්ධ, අන්ධකාරස්කන්ධයෙන්; ආවටං විය, වැසීම මෙනි.

225. පුප්ඵං, මල; අභෙත්වා, නොනළා; රසං, පුෂ්පරසය පමණක්; ආදියන්තා, ගන්නාවූ; අලයො යථා, භෘඞ්ගයන් සෙයින්; සත්තෙ, වැසියන්; අබාධෙත්වා, නොපෙළා; සුඞ්කෙ, සුංකම්; (අයබදු) ඛෙප්පිතෙ, ගත්කල්හි; උභයත්ථො භවෙ, (රජුන්ට) උභය ලොකාර්ථයම වේ.

226. මීයමානාපි, මැරෙන්නාහුද; අත්තාසිතානං, ස්වකීය ශ්‍රිත යන්ට; දුක්ඛය්‍යං, දුක්විය යුත්තක්; නොදෙන්ති, නොදෙත්; රාවණෙන, රාවණයා විසින්; කණ්ඨස්සස, මළනුහට; සිඛඟුසණං, අංසකාන පළන්; ධාරිතං, දරවනලදී.

227. අසාධවො, අසාධූන්; හිත්වාන, හැර; සාධූහී, සාධූන් සමග; උභයත්ථං, දෙලෝවැඩ; කුරු, කර; අමිතා, අප්‍රමාණවූ; සිරි, ඉසුරද; තෙජො,

228. ආණා වත්තති රජ්ජන මකාතෙපි දිසාජයෙ,
සකෙසා දස දිසන්තෙසු දිප්පන්තෙ'ව දිවෙ ඨිතො.

229. රංසිනොභාසනං දෙවෙ පුණ්ණිඤ්ඤ සරදෙ යථා,
මනුඤ්ඤත මුපෙක්ඛාය තරිඤ්ඤ 'පි 'ධ දිප්පරෙ.

230. සත්තුඝිනි පාණඝාති පාපං 'මඤ්ඤ 'ගුණස්සුති,
වත්තාරො'මෙ අනත්ථානි පරස්සිනං නිසෙවිනො.

231. ජලා 'ජනෙත්වා සම්පත්ති මබ්‍යත්තා නිද්ධනිධනෙ,
පණ්ඩිච්චං ච පදීපෙන්ති යිඞ්ඞං තුච්ඡ ජනිස්සියං.

232. චක්කවත්තී සිරිං නාකෙ සිරියෙ'කෙ සමෙන්ති යෙ,
සබ්බාය සිරියායෙව මණිසොණෙණ සමෙන්ති තෙ·

---

තෙනදද; පරස්සනම්, පරාශ්‍රිතවූද යන; සෙවිනෝ, සිඞල්ලෝ; අවවයා, මරණින්; නාසෙන්නනි එව, නැසෙත්මැයි.

228. දිසාජයෙ, දිග්විජය; අකනෙපි, නොකල කල්හිදු; රජ්ජනං, රජුන්ගේ; ආණා, ආඥව; වත්නනි, පවත්සි; සකෙසා, ශත්‍රුතෙව; දිවෙ ඨිතා, දෙව්ලොව සිටිසේ; දසදිසන්තෙසු, දශදිගන්ත යන්හි; දිප්පන්ති එව, බැබලෙත්මැයි.

229. සරදෙ, සරකල්හි; දෙවෙ, අහස්හි; පුණ්ණිඤ්ඤ, පුන්සඳ; රංසිනා, රශ්මියෙන්; ඔභාසනං යථා, බැබලිම මෙන්; මනුඤ්ඤතං, මැනිවුත්තේ; උපෙක්ඛාය, උපෙක්ෂාවෙන්; තරිඤ්ඤපි, තිරිසුද; ඉධ, මේ ලොකයෙහි; දිප්පරෙ, බැබලෙත්.

230. සත්තුඝිනි, ශත්‍රුඝාතකද; පාණඝාති, ජිවිතඝාතියද; පාපං, පව්ද; අමඤ්ඤ අගුණස්සුති, නොමදවූ අගුණ ශ්‍රැතියද යන; ඉමෙ වත්තාරෙ අනත්ථා, මේ සිව් අවැඩ සතර; පරස්සිනං, පරස්ත්‍රීන්; නිසෙවිනො, සෙවනය කරන්නන්කරු; එන්ති, පැමිණෙත්.

231. අබ්‍යත්තා, නුවණනැති; ජලා, ජඩයෝ; සම්පත්තිං, සැපත; අජනෙත්වා, නූපයා; නිද්ධනිධනෙ, දුගීන්ගේ ධන ලෙසින්; තුච්ඡජනිස්සියං, ලඝුජනයන්ගේ සිරිත්ද කෙරෙහින්; ගිඞ්ඞංච, ගිජුවීමද; පණ්ඩිච්චං, මිථ්‍යා පාණ්ඩිත්‍යයද; පදීපෙන්ති, පහල කෙරෙත්.

232. යෙ එකෙ, යම් ඇතැම් ජනකෙනෙක්; චක්කවත්තී සිරිං, චක්‍රවර්තිශ්‍රිය, නාකෙසිරියා, දිව්‍යලොක ශ්‍රියහා; සමෙන්ති, සමකෙරෙද්ද; තෙ, ඒජනයෝ; සබ්බායසිරියා, සකලශ්‍රියහා; මණිසොණෙණ, මාණික්‍ය සවණියන්; සමෙන්ති එව, සමකරත් මැයි.

233. පුඤ්ඤුස්සන්නත්තං ජම්බුදීපො තතො සුරපුරා'ධිකං,
නෙ'දානෙ'ව මුනින්දෙ'ධ බුජ්ඣිත්වාන නිරොධදා.

234. කළිතස්සො සජ්ජනානං නාවිපාකොහි කඞ්ඛථ,
නාළිකෙරද්දුමො සාදු ඵලදො ජලදායිනො.

235. සාධු හිතක්‍රියා යාව මූලොච්ඡුඛාදනං විය,
අසාධු සඞ්ගමොයාව වග්ගොච්ඡු ඛාදනං විය.

236. සුණීභූය විභූහි පණ්ඩිතජනා! නෙකප්පකිච්චං භුවි
නිච්චං ජනිය සම්මොහකිරියං හිත්වා වසිත්වා සුඛං,
ලද්ධුං නිබ්බුතියා'ප'සෙස කලුසං සග්ගා පවග්ගං ධුවං
තං නෙකායු'පමාය භූසිතමිමං ලොකොපකාරං සුණා 'ති.

**ලොකොපකාරොයං නිට්ඨිතො.**

---

233. ජම්බුදීපො, දඹදිව; තතො සුරපුර, ඒ දිව්‍යපුරයටත් වඩා; අධිකං, උතුම්වූ; පුඤ්ඤුස්සන්නත්තං, පුණ්‍යොත්සන්නත්වයෙනි; කුමක්හෙයිනිද යත්? මුනින්දා, බුදුවරයෝ; ඉධ, මෙහි; බුජ්ඣිත්වාන, චතුස්සත්‍යාවබොධය කොට; නිරොධදා, නිර්වාණ දායකවූවාහු; න ඉදානෙව, දැන්මත් (මෙකලපමණක්) නොවෙත්.

234. සජ්ජනානං, සාධූන්ට; කළිතස්සො, කලවැඩ; අවිපාකොහි, විපාකනැතැයි; නකඞ්ඛථ, සැකනොකරව්; නාළිකෙරද්දුමො, තෙරළි ගස; ජලදායිනො, ජලදායකයාහට; සාදුඵලදො, මධුරඵලදායකරත් තේසි.

235. සාධුහිතක්‍රියා, සාධූන්ගේ හිතක්‍රියාතොමෝ; යාවමූලා, අග පටන් මුලට; උච්ඡුඛාදනංවිය, උක් (දඬු) කෑම මෙන්; අසාධුසඞ්ගමො, අසජ්ජන සඞ්ගමයතෙම; යාවවග්ගා, මුලපටන් අගට; උච්ඡුඛාදනංවිය, උක්කෑම මෙනි.

236. භුවි, ලොකයෙහි; විභූතිපණ්ඩිතජනා, විභූතිය පතන සත්වය; සුණීභූය, නුවණැත්තෙක්ව; නිච්චං, අනවරතයෙන්; අනෙකප්පකිච්චං, විවිධාකෘත්‍යය; ජනිය, දූන; සම්මොහකිරියං, අභිසම්මොහක්‍රියා; හිත්වා, දුරුකොට; සුඛං, සැපසේ; වසිත්වා, වැස; අසෙස කලුසං අපි, නිරවශෙෂ දුශ්චරිතයත්; නිබ්බුතියා, නසා; ධුවං, ඒකාන්තයෙන්; සග්ගාපවග්ගං, ස්වර්ගය හා මොක්ෂය; ලද්ධුං, ලබනුපිණිස; අනෙකාය උපමාය, විවිධොපමායෙන්; භූසිතං, සෙබියාවූ; ඉමං ලොකොපකාරං, මේ ලොකොපකාර නම්වූ ප්‍රකරණය; සුණ, ශ්‍රවණය කර.

—නිමි—



